# මෙම අත්පොත

නේවාසික මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන සේවාලාභීන්ගේ ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාවලිය හා සම්බන්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන, ස්වේච්ඡා සංවිධාන මෙන්ම පෞද්ගලිකව පවත්වාගෙන යනු ලබන ප්‍රතිකාර මධ්‍යස්ථානයන්හි ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා  මෙම අත්පොත මාර්ගෝපදේශ සපයනු ලබයි.

# පෙරවදන

මත්ද්‍රව්‍ය නිවාරණය ප්‍රතිකාරය හා පාලනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක ජාතික ආයතනය වශයෙන් 2024 වර්ෂය තුල හතලිස් වසරක සංවත්සරය සමරන ලබන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මුළුමහත් ශ්‍රී ලංකාව තුල මත්ද්‍රව්‍ය නිවාරණය, පාලනය, ප්‍රතිකාරය හා පුනරුත්ථාපනය සම්බන්ධයෙන් ඉතා සුවිශේෂී වූ කාර්යයන් බොහෝමයක් සිදු කරමින් සිටිනු ලබයි. ඒ අනුව ප්‍රතිකාරය හා පුනරුත්ථාපනය සඳහාද සුවිශේෂී දායකත්වයක් ලබා දෙමින් භාවිතයට යොමු වූ පුද්ගලයින් පුනරුත්ථාපනය කර උපදේශනාත්මක ප්‍රතිකාරයන් මගින් ප්‍රතිකාරාත්මක දායකත්වය ලබා දෙමින් මත්ද්‍රව්‍ය පුනරුත්ථාපනය හා ප්‍රතිකාරයන් සඳහා ශක්තිමත් ක්‍රියාමාර්ගයන් මගින් සුවිශේෂි දායකත්වයක් ආයතනික මට්ටමින් ලබා දෙනු ලබයි.

පුනරුත්ථාපන හා ප්‍රතිකාරාත්මක සේවාවන් ඵලදායි හා කාර්යක්ෂම ලෙසත් ගුණාත්මක ලෙසත් සිදුකරලීම සඳහා නිසි ප්‍රතිකාරය හා පුනරුත්ථාපනය පදනම් කරගෙන සියලු පාර්ශව වෙත සැපයීම තහවුරු කරමින් අවශ්‍ය මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් සංවර්ධනය කර ඇති අතර ඒ සඳහා කැපවීමෙන් කටයුතු කරන විවිධ පාර්ශව ධාරිතා සංවර්ධනයත්, යාවත්කාලීන දැනුම හා පුහුණුව අඛණ්ඩ සංවර්ධනය උදෙසා ලබා දෙමින් සිටී.

මෙම කාර්ය සංග්‍රහය සකස් කිරිමේදී මත්ද්‍රව්‍ය නිවාරණය හා ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතුවල නිරත නිලධාරීන් විසින් ලබාගෙන ඇති ක්ෂේත්‍රයේ අත්දැකීම් පුද්ගල හා කණ්ඩායම් අත්දැකිම් විවිධ අවස්ථාවන්හීදි ඔවුනොවුන් මුහුන දුන් හා මුහුන දීමට සිදුවන මෙන්ම වසර ගණනාවක වෘත්තීමය අත්දැකීම් අනුසාරයෙන් මත්ද්‍රව්‍ය පිළිබඳ නිසි ප්‍රතිකාරාත්මක හා පුනරුත්ථාපන ක්‍රියාවලියක අවශ්‍යතාවය හඳුනා ගනිමින් ඒ අනුව සකස් කරගත් ඉතා ඵලදායි හා ගුණාත්මක ප්‍රතිකාර කාර්යක් සිදු කිරීම පිළිබඳවත් ඒ මගින් ශ්‍රී ලාංකික පුරවැසියා හට හා ජාතික ප්‍රතිපත්ති තුලින් අපේක්ෂිත කාර්යය කොටස ද ගුණාත්මකව ඉටු කරලීමට හැකියාව මෙමගින් ලැබෙනු ඇත.

ප්‍රතිකාර හා පුනරුත්ථාපන කාර්යය සඳහා මෙලෙස කාර්යය සංග්‍රහය මගින් නිලධාරීන් හට මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සම්බන්ධයෙන් නව දැනුම, පුහුණුව හා නව ක්‍රමවේද අනුගමනයත්, පුද්ගලයා, පුද්ගල ගතිකත්වයත් ඒ අනුව මත්ද්‍රව්‍ය භාවිතය හා අනිකුත් සියලුම පාර්ශවයන් පිළිබඳවත්, වත්මන් ශ්‍රී ලංකාව හා සමාජයත් යන විවිධ වූ පැතිකඩයන් හා විශාල වූ

විෂය පථයක් මෙම සංග්‍රහය මගින් විවර වන අතර ඒ හරහා කටයුතු කරන අයුරුත් එම කාර්යය ඉතා කාර්යක්ෂමවත් හරවත්වත් ඉටු කරලීමට නිලධාරීන් වශයෙන් භාවිත පුද්ගලින් හට කෙසේ නම් සහය වන්නේද යන්නත් ප්‍රතිකාරාත්මක මැදිහත් වීමත් මෙමගින් පෙන්වා දි ඇත.

ඒ අනුව මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් ප්‍රජාවක් නිර්මාණය කිරීම සඳහා අත්දැකීමෙන් හා දැනුමින් පොහොසත් නිලධාරීන්ගේ දායකත්වය මගින් මත්ද්‍රව්‍ය භාවිත පුද්ගලයින් නිසි ක්‍රමවේදයානුකූලවත්, නිවැරදිවත්, ප්‍රතිකාරාත්මක පුනරුත්ථාපන ක්‍රියාවලියක් මගින්නුත්, සංවර්ධිත පුද්ගලයෙකු බිහි කිරීමවස් මෙම කාර්ය සංග්‍රහය උපයෝගී කර ගැනීම ඉතා යෝග්‍ය දායකත්වයක් සැපයිය හැකිය.

ශාක්‍ය නානායක්කාර

සභාපති

# ස්තුතිය

ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාවලිය තවදුරටත් ව්‍යාප්ත කරලීම හා සංවර්ධනය කිරීම සඳහා පුනරුත්ථාපන හා ප්‍රතිකාර අංශයේ නිලධාරීන්ගේ දැනුම හා අත්දැකීම්ද, මත්ද්‍රව්‍ය ක්ෂේත්‍රයේ විවිධ අංශයන් නියෝජනය කරනු ලබන විවිධ ආයතන හා ඒවායෙහි සක්‍රීය ක්‍රියාකරුවන් ලෙස කටයුතු කරන නිලධාරීන්ගේද සහය හා දැනුම් අත්දැකීම් අනුසාරයෙන් මෙම කාර්ය සංගහ්‍රය සකස් කිරීම සිදු වූ අතර මෙම කාර්ය සංගහ්‍රයේ වැදගත්කම ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා තවදුරටත් සකස් විය යුතු හා යාවත්කාලීන විය යුතු දේ පිළිබඳව ද ප්‍රතිකාර හා පුනරුත්ථාපන කාර්යේ නියැලෙන සියලුම නිලධාරීන් හට ඔවුන්ගේ දැනුම සංවර්ධනය උදෙසා නිවාරණ ප්‍රතිකාර පුනරුත්ථාපන යන ක්ෂේත්‍රයෙහි අත්දැකීම් ඇති හා බොහෝ එලදායි කාර්යන් රැසක් හා පර්යේෂණාත්මක වැඩසටහන් සමුච්චයක එලදායි කාර්යන් රැසක් ඉටු කරලීම උදෙසා මෙම කාර්ය සංග්‍රහය සකස් වී තිබේ.

මෙලෙස ප්‍රතිකාර කාර්ය සංග්‍රහය සකස් කිරිමේදී ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය හා නායකත්වය ලබාදෙමින් අවශ්‍ය තාක්ෂණික මග පෙන්වීම් ලබා දුන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති ශාක්‍ය නානායක්කාර මැතිතුමාට ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශයේ ස්තුතිය පුද කරමි. එලෙසම සියලුම පරිපාලන කාර්යන් සඳහාද කාර්ය සංග්‍රහය සකස් කිරීමට අවශ්‍ය සහය දැක් වූ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් ලක්ෂාන්ද සොයිසා මැතිතුමාට ද බාහිර සේවා අංශයේ ද පර්යේෂණ අංශයේද අධ්‍යාපන අංශයේද සහය නොමදව මෙම සංග්‍රහයේ ගුණාත්මක වර්ධනයට දායකත්වය ලද බැවින් ඒ ඒ අංශයන්හි සහකාර අධ්‍යක්ෂවරුන් සඳහාද අනිකුත් සහය දැක්වූ නිලධාරීන් සඳහාද විශේෂ ස්තුතිය පුද කරමි.

ඉතා සුවිශේෂිතම කාර්යක් වන මෙම කාර්ය සංග්‍රහය එළිදැක්වීම සඳහා එය සකස් කොට මුද්‍රණය කර පූර්ණ අනුග්‍රහකත්වය ලබා දුන් ජපන් ජාත්‍යාන්තර සහයෝගිතා ආයතනයට ( Japan International Cooperation Agency – JICA ) අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රණාමය සහ ස්තුතිය පුදකරමි.එ ම කටයුතු සම්බන්ධීකරණයේදී සහය දැක්වූ JICA ආයතනයේ ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති විශේෂඥ නාමල් රළපනාව මහත්මියට ස්තුතිය පුද කරමි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සේවාවන් වඩාත් කාර්යක්ෂමව හා විධිමත්ව සැපයීම සඳහා අවශ්‍ය සහාය හා පහසුකම් සලසන මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍යතුමා, ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරීන්ට සහ සියලු මණ්ඩලීය සාමාජික නිලධාරීන්ට ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශයේ ස්තුතිය පුද කරමි.

ප්‍රතිකාර හා පුනරුත්ථාපන කාර්ය සංග්‍රහය සකස් කිරීම සඳහා කැපවීමෙන් කටයුතු කළ සහ සිය ක්ෂේත්‍රයේ අත්දැකීම් පාදක කරගනිමින් වඩාත් ප්‍රායෝගික සහ දේශීය සන්ධර්භයට වඩාත් ගැළපෙන ප්‍රතිකාර හා පුනරුත්ථාපන ආකෘතියක් සකස් කර ගැනීමට දායකත්වය දැක්වූ ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශයේ සියලුම කාර්ය මණ්ඩලයට හෘදයාංගම ස්තුතිය පුද කරමි. එමෙන්ම මෙම කාර්ය සංග්‍රහයේ ඇතුලු පිටු සැකසුම සහ පිටකවරය නිර්මාණය කරන ලද උපදේශන සහකාර ඩබ්.ඒ.ඩී. ප්‍රියදර්ශනී මහත්මියට ද ඒ සඳහා ස්තුතිය පළකර සිටිමි. කාර්ය සංග්‍රහය සකස් කිරීම සම්බන්ධයෙන් කැපවීමෙන් කටයුතු කළ ප්‍රතිකාර අංශයේ සංස්කාරක මණ්ඩලය නියෝජනය කළ සියලු නිලධාරීන්ට මෙන්ම ඒ සඳහා සහය දැක්වූ බාහිර සේවා අංශය, නිවාරණ හා අධ්‍යාපන අංශය හා පර්යේෂණ අංශයේ සියලුම නිලධාරීන්ට ද නැවතත් ස්තුතිය පුද කරමි.

සහකාර අධ්‍යක්ෂක ප්‍රතිකාර හා පුනරුත්ථාපන

රෝෂන් ගුණවර්ධන

# පටුන

**පිටු අංක**

පෙරවදන ........ 2

ස්තුතිය........ 4

2. අන්තරායකර ඖෂධ පාලනයට බලපැවැත්වෙන අණ පනත් ........ 12

3. ප්‍රතිකාරසේවා සඳහා සේවලාභීන් යොමු වීම. ........ 14

4. විධිමත්ව පවත්වාගෙන යනු ලබන පුනරුත්ථාපන මධ්‍යස්ථානයක ධූරාවලියක් සඳහා නිදර්ශකයක්........ 15

5. පූර්ව උපදේශනය ........ 16

5.1 හැඳින්වීම ........ 16

5.2. භාවිතයෙන් නිදහස් වීමට ඇති කැමැත්ත අනුව සේවාලාභීන් වර්ගීකරණය ........ 17

5.2.1. භාවිතයෙන් ඉවත් වීමට අකමැති සේවාලාභීන් සඳහා සිදු කරන මැදිහත් වීම........ 17

5.2.2. භාවිතයෙන් ඉවත් වීමට අදහසක් ඇතත් ඒ පිළිබඳ ස්ථිර බවක් නැති සේවාලාභීන් සඳහා සිදු කරන මැදිහත් වීම. ........ 17

5.2.3. මත්ද්‍රව්‍යයෙන් නිදහස් වීමට කැමැත්තක් දක්වන සේවාලාභීන් සඳහා සිදු කරන මැදිහත් වීම. ........ 18

5.2.4. කෙටි කලක් මතින් ඈත්ව සිටින සේවාලාභීන් සඳහා සිදු කරන මැදිහත් වීම. ........ 18

5.2.5. මත්ද්‍රව්‍යය භාවිතය නවතා සිටින සේවාලාභීන් සඳහා සිදු කරන මැදිහත් වීම. ........ 18

5.3. පූර්ව උපදේශනයේදී සැලකිලිමත්විය යුතු මූලික කරුණු. ........ 19

5.3.1. සේවාලාභියා සමග පූර්ව උපදේශනය........ 20

5.3.2. භාරකරුවන් සමග පූර්ව උපදේශනය ........ 21

6. සේවාලාභීන්නේවාසික ප්‍රතිකාර සඳහා ඇතුළත් කිරීම ........ 22

7. ප්‍රතිකාර ක්‍රියාවලිය ........ 24

7.1. ප්‍රතිකාර ක්‍රියාවලිය හැඳින්වීම ........ 24

7.2. විරමණ අපහසුතා කළමණාකරණය ........ 26

8. සේවාලාභීන්ගේ අයිතිවාසිකම් හා වගකීම්. ........ 27

8.1. සේවාලාභින්ගේ අයිතිවාසිකම්. ........ 27

8.2. සේවාලාභීන් සඳහා පුනරුත්තාපන ආයතනයක් තුළ බල පැවැත්වෙන කොන්දේසි. ........ 27

8.3. පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් තුළ කාර්ය මණ්ඩලයට අදාල ආචාර ධර්ම සංග්‍රහය ........................28

8.4. සේවාලාභීන්ගේ විනය පාලනය.................................................................................................30

9. සේවාලාභීන් තුළ මත්ද්‍රව්‍ය පිළිබඳ ආකර්ෂණය සහ බැඳීම ශූන්‍ය කරන ආකාරය...................................31

9.1 හැඳින්වීම.........................................................................................................................31

9.2. මත්ද්‍රව්‍යය සඳහා ආකර්ෂණය සහ බැඳීම ගොඩනැගෙන ආකාරය ..................................................31

9.3. මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් මේ වන විට සමාජය තුළ ගොඩ නැගී ඇති වැරදි මතවාද කිහිපයක් .........32

9.4. භාවිතයෙන් නිදහස් වීම සඳහා චර්යාත්මක වෙනස්කම්.................................................................33

9.5. භාවිතයෙන් නිදහස් වීම සඳහා සේවාලාභියෙකු විෂයෙහි සිදු කළ හැකි චර්යාමය මැදිහත් වීම් කිහිපයක්.......................................................................................................................33

9.6. මත්ද්‍රව්‍ය අපේක්ෂාවන් අභියෝග කිරීම .........................................................................34

9.7. මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි ඉගෙනුම් පද්ධතිය අභියෝග කරමින් භාවිතයට ඇති බැඳීම ශූන්‍ය කිරීම සඳහා යොදා ගත හැකි මනෝවිද්‍යාත්මක ප්‍රවේශයන් ...............................................................35

10. දෛනික වැඩසටහන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම. .........................................................38

10.1. ප්‍රතිකාරාත්මක අගයක් සහිත උදෑසන හමුවකට සුදුසු වැඩසටහන් පෙළගැස්මක්..........................38

10.2. අධ්‍යාපන වැඩසටහන්.......................................................................................................40

10.3. පුද්ගල උපදේශනය .........................................................................................................41

10.4. ක්‍රීඩා සහ විනෝදාත්මක වැඩසටහන්....................................................................................41

10.5. නිශ්ශබ්ද කාලය ...............................................................................................................41

10.6. සේවාලාභීන් සඳහා විශේෂිත ක්‍රියාකාරකම්...........................................................................41

10.7. ප්‍රතිකාර මධ්‍යස්ථානයක දෛනික කාල සටහනක් සඳහා නිදර්ශකයක්........................................44

11. අධිකරණ නියෝග මත සේවාලාභීන් ප්‍රතිකාරයට යොමු කිරීම. ...................................................45

11.1. හැඳින්වීම ......................................................................................................................45

11.2. අධිකරණය මගින් සේවාලාභීන් ප්‍රතිකාර සඳහා ඇතුළත් කර ගැනීමේදී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ........................................................................................................................48

11.3. අධිකරණය මගින් යොමු කළ සේවාලාභියෙකු ප්‍රතිකාරය සඳහා ඇතුළත් කර ගැනීමට අදාළ මාර්ගෝපදේශ........................................................................................................................49

11.4. අධිකරණය මගින් යොමු කළ සේවාලාභියෙකු ප්‍රතිකාර වැඩසටහන තුළ රඳවා තබා ගැනීමට අදාළ මාර්ගෝපදේශ ......................................................................................................................51

11.5. අධිකරණය මගින් යොමු කළ සේවාලාභියකු ප්‍රතිකාරයෙන් බැහැර කිරීමට අදාළ මාර්ගෝපදේශ...52

11.6. විශේෂ බැහැර වීම් ......................................................................................................53

12. ඇගයීම, අනාගත සැළසුම් සකස් කිරීම හා බැහැර කිරීම......................................................54

12.1. සේවාලාභියෙකු ඇගයීම ..............................................................................................54

12.1. (අ) පළමු ඇගයීම ..................................................................................................55

12.1.(ආ.) දෙවන ඇගයීම ..................................................................................................55

12.2. සේවාලාභීන්ගේ ප්‍රගති තක්සේරුකරණ ක්‍රමවේදය...............................................................56

12.3. සේවාලාභියාගේ ප්‍රගතිය (තක්සේරුකණය මගින් මනින ලද) සේවාලාභියා සමග සාකච්ඡා කිරීම අනාගත සැළසුම සකස් කිරීම සහ අනාගත සැළසුම පිළිබද සම්මුතිගත වීම. .......................................57

12.4. සේවාලාභියාගේ අනාගත සැළසුම පිළිබදව භාරකරුවන්ට පූර්ණ අවබෝධයක් ලබා දීම හා ක්‍රියාත්මක කිරීමට සහය එල කිරීම සදහා සම්මුතිගතවීම.....................................................58

12.5. සේවාලාභියෙකු ආයතනයෙන් බැහැරවීම හෝ බැහැර කිරීම .........................................58

12.5.1. සේවාලාභියෙකු ප්‍රතිකාර මධ්‍යස්ථානයෙන් බැහැර වන අවස්ථා...........................................59

12.6. සාමාන්‍ය ලෙස සේවාලාභියකු බැහැර කරන මොහොත වන විට සපුරා තිබිය යුතු කොන්දේසි. ....61

12.7. සේවාලාභීන් බැහැර කිරීමට අදාලව ගත යුතු තාක්ෂණික ක්‍රියාමාර්ග.........................................62

12.7.(අ). ස්වේච්ඡාවෙන් ඇතුළත් වූ සේවාලාභියෙකු ආයතනයෙන් බැහැර කිරීම.............................62

12.7.(ආ). අධිකරණය මගින් යොමු කරනු ලබන සේවාලාභියකු ආයතනයෙන් බැහැර කිරීම..............62

12.7.(ඇ). සේවාලාභියෙකු ආයතනයෙන් අනවසරයෙන් බැහැර වීම..................................................63

12.7.(ඉ). පිළිගත හැකි සෞඛ්‍යමය අවශ්‍යතා, ප්‍රතිකාරාත්මක (පුනරුත්ථාපන) අවශ්‍යතා සහ පුද්ගලික අවශ්‍යතා මත කෙටි කාලසීමාවක් සඳහා වන බැහැරවීම්..........................................................64

12.7.(ඉ). සේවාලාභියෙකු මිය යාම හෝ සියදිවි නසාගැනීම..........................................................65

13. පසුරැකවරණය ..........................................................................................................67

13.1. පසුරැකවරණයේ වැදගත්කම..........................................................................................67

13.2. පසුරැකවරණයේ අරමුණු...............................................................................................67

13.3. පසුරැකවරණ ක්‍රියාවලිය. ..............................................................................................67

13.3.1 පුනරුත්ථාපන මධ්‍යස්ථානය මගින් සිදුකෙරෙන පසුරැකවරණ ක්‍රියාවලිය. .............................68

13.3.2. බාහිර සේවා නිළධාරී මගින් හා අදාල ක්ෂේත්‍ර නිළධාරීන් මගින් සිදු කෙරෙන පසුරැකවරණ ක්‍රියාවලිය.......................................................................................................................69

13.4. පසුරැකවරණයේදී සේවාලාභියාගෙන් අපේක්ෂා කරනු ලබන මැදිහත් වීම. ..................................70

13.5. පසුරැකවරණයේදී භාරකරුවන්ගෙන් අපේක්ෂා කරනු ලබන මැදිහත්වීම. ......................................71

13.6. පසුරැකවරණයේදී ආයතනය විසින්  සැලකිලිමත් වියයුතු කරුණු ............ 72

14. ඇමුණුම් ............ 73

ඇමුණුම 01 - උපදේශන පත්‍රිකාව ............ 73

ඇමුණුම 02 - ජීව දත්ත සටහන ............ 74

ඇමුණුම - 03 - සේවාලාභී තක්සේරු පෝරමය ............ 75

ඇමිණුම - 04 - නේවාසික සේවාලාභීන් විසින් පිළිපැදිය යුතු කොන්දේසි මාලාව ............ 79

සහ පොරොන්දු මාලාව ............ 79

ඇමුණුම -05 සෞඛ්‍ය තත්ත්වය ............ 80

ඇමුණුම 06 - විරමණ අපහසුතා මඟහැරීමේ ක්‍රියාවලිය ............ 82

ඇමුණුම 07 - සුවවීමේ සම්පත් බල මණ්ඩලය ............ 84

ඇමුණුම 08 - ආයතනයෙන් බැහැරවීමේ සටහන් පත්‍රය ............ 85

ඇමුණුම  09  - පසුරැකවරණ වැඩසටහන ............ 86

15. අමතර කියවීම් ............ 90

සිද්ධි අධ්‍යන වාර්ථාවක් සඳහා සුදුසු අකෘති පත්‍රයක් ............ 90

ප්‍රතිකාර සැළසුමක් සඳහා දළ අකෘති පත්‍රයක් ............ 94

ප්‍රතිකාර සැලැස්ම (Treatment Plan) ............ 94

තක්සේරුකරණ පෝරමයක් සඳහා නිදර්ශකයක් ............ 99

උපදේශක මණ්ඩලය ............ 117

# 1. හැඳින්වීම

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1984 අංක 11 දරණ අන්තරායකර ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩල පනතයටතේ 1984 අප්‍රේල් 09 වන දින ආරම්භ කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. අන්තරායකර ඖෂධ අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ පාලනයට අදාලව ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම, අන්තරායකර ඖෂධ වැළැක්වීම සහ පාලනයට අදාල නියෝජ්‍යායතන ඒකාබද්ධ කිරීම, අන්තරායකර ඖෂධ පාලනය සම්බන්ධව ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර සංවිධාන අතර සබඳතාවය පවත්වාගෙන යාම, අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහි වූ තැනැත්තන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාමාර්ග ඉහළ නංවාලීම මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් වේ.

මේ වන විට මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය ඉහත බලතල ප්‍රකාරව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මාර්ගෝපදේශ මත ක්‍රියාත්මක වේ. කෙසේ නමුත් මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් ඉන් නිදහස්වීම උදෙසා කඩිනමින් ප්‍රතිකාර වලට යොමු නොවන බවක් දක්නට ඇති අතර ඊට හේතු ලෙස ප්‍රතිකාර සේවාවන් පිළිබඳ නිසි අවබෝධයක් නොමැති බව සහ ප්‍රතිකාර සඳහා ඇතුළත්වීමට කිසියම් බියක් පැවතීම යන සාධක හඳුනාගත හැක.මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපනයේදී මත්ද්‍රව්‍යය භාවිතය ආශ්‍රිත ගැටළු ඇති පුද්ගලයෙකුට එම ගැටළු නිරාකරණය කර ගැනීමට හා මත්ද්‍රව්‍යට ඇති බැඳීම ශූන්‍ය කර ගැනීමට සහය වීමේ ක්‍රියාවලිය පුනරුත්ථාපනය වශයෙන් හැඳින්විය හැකිය. සමස්තයක් ලෙස ප්‍රතිකාර ක්‍රියාවලිය මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් හඳුනා ගැනීම, භාවිතයෙන් නිදහස් වීම සඳහා සහය වීම (නිරෝධනය) සහ සමාජගත වීමෙන් පසු භාවිතයෙන් නිදහස්ව පැවතීමට අදාලව පසුරැකවරණ කටයුතු සිදු කිරීම යන පියවරයන්ගෙන් සමන්විත වේ.

මෙයට අමතරව භාවිතයෙන් නිදහස් වූවන්ගේ දුම්කොළ, මධ්‍යසාර, ගංජා, හෙරොයින්, මෙතැම්පිටමයින්, ආදී සියළු මත්ද්‍රව්‍යයන් කෙරෙහි තිබූ බැඳීම ශූන්‍ය කොට ඉන් නිදහස් වීමේදී ලද දැනුම අවබෝධය කුසලතාවය ප්‍රයෝජනයට ගනිමින් දැනට භාවිතයේ සිටින අයවලුන් ඉන් නිදහස් කර ගැනීම සඳහා සහයෝගය ලබා ගැනීමේ ක්‍රියාවලියද ඉතාම වැදගත් කරුණක් වේ. එමගින් මත්ද්‍රව්‍යය භාවිතය, වෙළදාම හා සමාජය තුළ පතුරවන වාහකයින් නොවී භාවිතයෙන් නිදහස් වීමට

සහය වන නිවාරකයින් බවට මත්ද්‍රව්‍ය භාවිතය නවතා දැමූ පිරිස් පරිවර්ථනය කර ගැනීම හරහා සමාජයට සාධනීය දායකත්වයක් ලබා ගැනීම ද ප්‍රතිකාර හා පුනරුත්ථාපනයේ මූලික අපේක්ෂාවකි.

මෙම ප්‍රතිකාර කාර්ය සංග්‍රහය නිර්මාණය කිරීමේ මූලික අරමුණ වන්නේ ඉහත සඳහන් කරන ලද ප්‍රතිකාර ප්‍රවේශයන් සාර්ථක කර ගැනීම සඳහා මාර්ගෝපදේශයන් සැපයීමයි. වර්ථමානය වන විට මත්ද්‍රව්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශය විසින්ම පවත්වාගෙන යනු ලබන අතර ඒවායේ ප්‍රතිකාරාත්මක ප්‍රවේශයන් කෙසේ විය යුතු ද යන්න පිළිබඳවත් මත්ද්‍රව්‍ය ප්‍රතිකාරයේ නිරත කාර්ය මණ්ඩලයන්හි භූමිකාව සහ කාර්යභාරය පිළිබඳ අවබෝධය පුලුල් කිරීමටත්මින් බලාපොරොත්තු වේ. එසේම රට තුළ ක්‍රියාත්මක සියලු ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළ තිබිය යුතු අවම සම්මත ප්‍රමිතීන් පිළිබඳව අවබෝධය පුලුල් කිරීම, සාක්ෂි මත පදනම් වූ ප්‍රතිකාරය විධිමත්ව භාවිතා කිරීම සඳහා මධ්‍යස්ථාන පෙළඹවීම, ජාත්‍යන්තර ප්‍රමිතිගතකරණයට අදාල මාර්ගෝපදේශයන් මධ්‍යස්ථාන තුළට ගෙන යෑම,මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්ෂේත්‍රයට එක් වන නවක නිළධාරීන්ගේ දැනුම පුලුල් කිරීම, ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළ හෝ ප්‍රජා පාදක කඳවුරු තුළ ඇතිවිය හැකි ගැටලු අවම කිරීම මෙන්ම ක්‍රියාත්මක විවිධ ප්‍රතිකාර අකෘතීන් වල අනන්‍යතාවය රැකෙන පරිදි ප්‍රතිකාර කටයුතු විදිමත් කිරීම යන අරමුණු සාධනය කර ගැනීම මෙම ප්‍රතිකාර කාර්ය සංග්‍රහය තුලින් බලාපොරොත්තු වේ.

මෙම ප්‍රතිකාර කාර්යය සංග්‍රහය තුළ ප්‍රතිකාරය සඳහා ඇතුළත් කරගැනීම, ප්‍රතිකාර කිරීම හා මුදා හැරීම පසුරැකවරණ ක්‍රියාවලිය මෙන්ම අධිකරණ නියෝග මත ප්‍රතිකාර සඳහා යොමු වන සේවාලාභීන්ට අදාලව කටයුතු කරන ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ සපයා ඇත.

## 2. අන්තරායකර ඖෂධ පාලනයට බලපැවැත්වෙන අණ පනත්

- 1984 අංක 11 දරණ අන්තරායකර ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩල පනත (මෙම පනත අවස්ථා දෙකක දී සංශෝධනය වී ඇත.)
- 1986 අංක 41 දරණ අන්තරාදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩල (සංශෝධන) පනත
- 1990 අංක 41 අන්තරාදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩල (සංශෝධන) පනත
- 1984 අංක 13 විෂ වර්ග අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත
- 1980 අංක 27 දරණ විලවුන් උපකරන සහ ඖෂධ පනත
- 2007 අංක 54 දරණ ඖෂධ වලට ඇබ්බැහි වූ තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පහත 2 වන වගන්තිය යටතේ නියමය (අති විශේෂ ගැසට් පත්‍රය)
- 2008 අංක 01 දරණ මාදක ඖෂධ හා මනෝ වර්ථක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත
- 2008 අංක 01 දරන මාධක ඖෂධ සහ මනෝවර්ථක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත (අති විශේෂ) ගැසට් පත්‍රය.
- මත්ද්‍රව්‍යය දුර්භාවිතය, නිවාරණය හා පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය
- 1961 - මාදක ඖෂධ පිළිබඳ එක පාර්ශවීය ගිවිසුම
- 1971 - මනෝවර්තක මත්ද්‍රව්‍ය පිළිබඳ ගිවිසුම
- 1988- මාදක ඖෂධ සහ මනෝවර්ථක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති ගිවිසුම
- 1983- අංක 2 දරණ දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන
- 1969 අංක 17 දරණ රේගු ආඥා පනත
- ආයතන සංග්‍රහයේ විධි විධාන
- 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන පනත


- 1961 අංක 31 දරන ආයුර්වේද පණත
- 1962 අංක 5 දරණ ආයුර්වේද පනත (සංශෝධන)
- 1929 අංක 17 දරණ විෂ වර්ග අබිං හා අන්තරායක ඖෂධ පාලන පනත
- 1986 අංක 26 දරණ විෂ වර්ග අබිං හා අන්තරායක ඖෂධ පාලන පනත
- 1990 අංක 18 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය
- 2006 අක 27 දරණ දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනත
- 2009 අංක 41 දරණ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පනත

## 3. ප්‍රතිකාරසේවා සඳහා සේවලාභීන් යොමු වීම.

නේවාසික මත්ද්‍රව්‍යය පුනරුත්ථාපනය සඳහා, සේවාලාභීන් ඇතුලත් කරගැනීම සේවාලාභියාගේ කැමැත්ත මත පදනම් වේ.

සේවාලාභීන් ප්‍රතිකාර සඳහා ස්වයං යොමුවීම, පවුලේ සාමාජිකයන් හා භාරකරුවන්, බාහිර සේවා සපයන්නා වූ අංශ, දුරකථනමාර්ග, ප්‍රජා ව්‍යාපෘති නිවාරණ වැඩසටහන්, නේවාසික ප්‍රතිකාර ලබා ගත් සේවාලාභීන් සහ රාජ්‍ය හා රාජ්‍ය  නොවන සංවිධාන යනාදී ක්‍රම හරහා මධ්‍යස්ථාන වෙතයොමුවීම සිදුවේ.එසේම අධිකරණය මගින් ද ඇතැම් අවස්ථාවල ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහා සේවාලාභීන් යොමුකරනු ලැබේ.

**4. විධිමත්ව පවත්වාගෙන යනු ලබන පුනරුත්ථාපන මධ්‍යස්ථානයක ධූරාවලියක්   සදහා නිදර්ශකයක්**



# 5. පූර්ව උපදේශනය

## 5.1 හැඳින්වීම

මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ පුද්ගලයින් ඉන් නිදහස්වීම සඳහා පුනරුත්ථාපනයට යොමු වන අවස්ථාවේදී ප්‍රතිකාර ආරම්භ කිරීමට පෙර ඔවුන් පූර්ව උපදේශන ක්‍රියාවලියක් සඳහා යොමු කරනු ලබයි.

මත්ද්‍රව්‍යයටඇබ්බැහි වී ප්‍රතිකාර සඳහා පැමිණෙන බහුතරයකගේ ස්වාභිමානය ඉතා පහල තලයක පවතී. ආත්ම විශ්වාසය බිඳවැටීමට හා අපේක්ෂා භංගත්වයට පත් වී ඇත. ඊට හේතු වී ඇත්තේ ඔවුන් තම පවුලේ සාමාජිකයන්, තම පරිසරය තුල ජීවත්වන හිතවතුන්, යාළු මිත්‍රයන් ආදීන්ගේ විශ්වාසයට ලක් නොවීම හා ගැරහීමට පාත්‍ර වීම ය. ඒ අනුව ප්‍රතිකාර පුනරුත්ථාපනයට යොමු වන පිරිස වූ කලී මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ මෙන්ම බොහෝ කලක් තිස්සේ සමාජය තුළ ආන්තීකරණයට ලක් වූ සහ අඩු ආත්ම අභිමානයක් සහිත පිරිසක් වන අතරමෙම තත්වය වෙනස් කර ගැනීම සඳහා සහය අපේක්ෂාවෙන් පැමිණෙන පිරිසක් ද වේ.

ඒ අනුව පූර්ව උපදේශනයේ දී එක් ප්‍රධාන අරමුණක් විය  යුත්තේ ඔවුන් තුළ බිඳවැටී ගිය ස්වාභිමානය ඉහල නංවමින්  ඔවුන් හට යම් සාමාජීය පීඩනයක් මධ්‍යයේ වුව ද තමා සතු විභව ශක්තිය වැඩි දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය අභිප්‍රේරණය ලබා දීමයි.

උපදේශකවරයා විසින් සේවාලාභියාගේ මත්ද්‍රව්‍යය ගැටළුව පමණක් නොව ඔවුන්ගේ අදහස් හා හැඟීම් පද්ධතිය අවබෝධ කර ගැනීමත් සැසිය අවසන් වන තුරු සහකම්පනය පවත්වා ගැනීමත් සිදු කළ යුතු වේ. මෙමගින් උපදේශකවරයා හා සේවාලාභියා අතර, විශ්වාසනීයභාවය, ගරුත්වය, යහපත් ප්‍රතිචාර හා සහසම්බන්ධතාවය සහ ප්‍රතිකාර වැඩසටහන කෙරෙහි පිළිගැනීම ගොඩනැගෙනු ඇත.ඒ තුළින් පූර්ව උපදේශනයට පැමිණි පුද්ගලයාට තම අරමුණ ඉටුකර ගැනීමට ප්‍රබල චේතනාවන් ගොඩ නැගෙනු ඇත. උපදේශකවරයාගේ ද අවධානය ගිලිහී නොයනු ඇත. ඒ හේතුවෙන් උපදේශකවරයාට මනා සැලසුම්කරණයත්, යහපත් අවබෝධයත් තුළින් කටයුතු සාර්ථක කර ගැනීමේ හැකියාව ලැබෙනු ඇත.

පූර්ව උපදේශනය පුද්ගලයාගේ අවශ්‍යතා සහ අභියෝග අවබෝධ කර ගැනීමට උපකාර වන අතර, සේවාලාභියාගේ ප්‍රජානන සාධක,චර්යාත්මක සාධක,මනෝවිශ්ලේෂණ සාධක අවබෝධකර ගැනීමට

හැකි වේ. එසේම සේවාලාභියාගේචින්තන රටාව, ආකල්ප, කුසලතා අවබෝධ කර ගැනීමට හා ඔවුනට ගැළපෙන ප්‍රතිකාර අකෘතිය තීරණය කිරීමට ඉඩ සලසයි.

## 5.2. භාවිතයෙන් නිදහස් වීමට ඇති කැමැත්ත අනුව සේවාලාභීන් වර්ගීකරණය

මත්ද්‍රව්‍යයෙන් නිදහස්වීම සම්බන්ධ විවිධ අදියරයන් පසු කරන සේවාලාභීන් පූර්ව උපදේශනය සඳහා යොමු විය හැක. කවර අදියරක පසු වූවද එම සෑම සේවාලාභියෙකු සඳහාම සේවා සැපයීම අත්‍යාවශ්‍ය කරුණකි. ඒ අනුව භාවිතයෙන් නිදහස් වීමට ඇති කැමැත්ත අනුව සේවාලාභීන් පහත පරිදි වර්ගීකරණය කළ හැකිය.

- භාවිතයෙන් ඉවත් වීමට අකමැති සේවාලාභීන්.
- භාවිතයෙන් ඉවත් වීමට අදහසක් ඇතත් ඒ පිළිබඳ ස්ථිර බවක් නැති සේවාලාභීන්.
- මත්ද්‍රව්‍යයෙන් නිදහස්වීමට කැමැත්තක් දක්වන සේවාලාභීන්.
- කෙටි කලක් මත්ද්‍රව්‍යයෙන් ඈත්ව සිටින සේවාලාභීන්.
- ස්ථිරවම මත්ද්‍රව්‍යයෙන් නිදහස්ව සිටින සේවාලාභීන්.

### 5.2.1. භාවිතයෙන් ඉවත් වීමට අකමැති සේවාලාභීන් සඳහා සිදු කරන මැදිහත් වීම.

- සේවාලාභියා සමඟ වෘත්තිය සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම.
- මත්ද්‍රව්‍යයෙන් නිසහස්වීමෙන් ලද හැකි ප්‍රයෝජන වාසි පිළිබද කල්පනා කිරීමට යොමු කිරීම.
- මත්ද්‍රව්‍යයෙන් නිදහස් වීමට ඇති සැක බිය පහවීම සඳහා කරුණු සාකච්ඡා කිරීම.
- භාවිතයෙන් නිදහස් වීම කල හැකි දෙයක් බව පැහැදිලි කිරීම.
- මත්ද්‍රව්‍යයෙන් නිදහස් වීමට ලබා දිය හැකි පහසුකම් හා සේවාවන් පිළිබඳ දැනුවත් කිරීම.
- විරමණ අපහසුතා සඳහා කල හැකි ක්‍රියාකාරකම් හඳුන්වා දීම.

### 5.2.2. භාවිතයෙන් ඉවත් වීමට අදහසක් ඇතත් ඒ පිළිබඳ ස්ථිර බවක් නැති සේවාලාභීන් සඳහා සිදු කරන මැදිහත් වීම.

- දැනට ඉන්නා මට්ටමේ වෙනසක් ඇති කර ගැනීමට ඇති ආශාව ශක්තිමත් කිරීම (ඉහත කරුණට අදාල උපදෙස් සහිතව).
- වෙනස ඇතිවීමේ දී මතුවන ප්‍රශ්න ගැටළු පිළිබඳ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

- භාවිතය නිසා වන හානිය දැකීමට පෙළඹීම.
- භාවිතයෙන් අත්මිදීමේ දී වන වාසිය දැකීමට පෙළඹීම.
- විරමණ අපහසුතා සඳහා කළහැකි ක්‍රියාකාරකම් හඳුන්වා දීම.
- නිවසේ සිට අත් මිදීමට පෙළඹවීම් සිදු කිරීම.

**5.2.3. මත්ද්‍රවයෙන් නිදහස් වීමට කැමැත්තක් දක්වන සේවාලාභීන් සඳහා සිදු කරන මැදිහත් වීම.**

- පෙලඹවීම ශක්තිමත් කිරීම.
- ගත යුතු ක්‍රියාමාර්ග සහ සැලසුම් පිළිබඳ දැනුවත් කිරීම.
- සුවවීම පිළිබඳ ස්ථිර හා පැහැදිලි ප්‍රකාශ ලබා දීම.
- ලද සීමිත සාර්ථකත්වය පුළුල් කර ගැනීම සඳහා යෝජනා අදහස් සාකච්ඡා කිරීම.
- නිවසේ සිට උත්සාහයක් ගෙන ඉල්ලක්ක ලඟා කර ගැනීම.
- අවශ්‍යය  නම් ප්‍රතිකාර සේවාවන් සඳහා යොමු කිරීම.

**5.2.4. කෙටි කලක් මතින් ඈත්ව සිටින සේවාලාභීන් සඳහා සිදු කරන මැදිහත් වීම.**

- හැසිරීම් රටාව පිළිබඳ සැලකිලිමත්වීම.
- නිදහස්ව සිටි කාලය තුල ලද ප්‍රගතීන් ඇගයීම.
- නැවත භාවිතයට යොමු වීම පිළිබඳ අවදානයෙන් සිටීම.
- නැවත භාවිත සිතිවිලි  පිළිබඳ ස්වයං අවබෝධය දියුණු කිරීම.
- නැවත භාවිතා කළහොත් ආරම්භයේ දීම ඊට අදාළ සේවාවන් වෙත යොමු කරවා ගැනීම.

**5.2.5. මත්ද්‍රව්‍යය භාවිතය නවතා සිටින සේවාලාභීන් සඳහා සිදු කරන මැදිහත් වීම.**

- දැනට පවතින වෙනස (දියුණුව) අගය කිරීම.
- මත්ද්‍රව්‍යය භාවිතා කරන අය ඉන් නිදහස් කිරීම සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම (සම්පත්දායකින් ලෙස).
- ප්‍රජා මත්ද්‍රව්‍යය නිවාරණ හා ප්‍රජා ප්‍රතිකාර වැඩසටහන් සඳහා දායක වීමට පෙළඹවීම.

- නිවාරණ හා ප්‍රතිකාර වැඩසටහන් සිදු කරන ආයතන හා සංවිධාන සමඟ සම්බන්ධතා පැවැත්වීම සඳහා පෙළඹවීම.
- ප්‍රජාව තුළ සහ ප්‍රතිකාර මධ්‍යස්ථාන වල ප්‍රතිකාර ක්‍රියාවලිය සඳහා අවශ්‍යය දායකත්වය ලබා ගැනීම.

## 5.3. පූර්ව උපදේශනයේදී සැලකිලිමත්විය යුතු මූලික කරුණු.

- මත්ද්‍රව්‍ය භාවිතා කරන සේවාලාභියෙකු ආයතනය වෙත පැමිණීමෙන් පසු මධ්‍යස්ථානයේ සිටින පිළිගැනීමේ නිලධාරියා විසින් සේවලාභියා හා ඔහුගේ භාරකරුවන් ඉතාමත් හොඳින් පිළිගත යුතුය.
- ආයතනයට පැමිණි සේවාලාභියාගේ මූලික තොරතුරු ඒ සඳහා ඇති ලේඛන වල සටහන් කිරීමෙන් අනතුරුව අදාල උපදේශන නිලධාරියෙකු වෙත යොමු කල යුතු වේ.
- උපදේශන නිලධාරියා විසින් කුමන ආකාරයේ සේවාලාභියෙකු පැමිණිය ද ඉතා සුහදවපිළිගත යුතුය.
- සේවාලාභියා සමග හා භාරකරුවන් සමග වෙන වෙනමත් හා සියලු දෙනා ඒකාබද්ධවත් ලෙස අදියර තුනක් යටතේ පූර්ව උපදේශනය සිදු කළ යුතු ය.
- සේවාලාභියා එම මධ්‍යස්ථානයේ පූර්වයෙන් ප්‍රතිකාර ලබා ගත් අයෙක් නම් එම අවස්ථාවේ සිට පූර්ව උපදේශනය සිදු වන අවස්ථාව වන විට වසරක කාලයක් ගත වී නොමැති නම් ඔහුගේ එම ප්‍රතිකාර කාලයට ආදාල ලිපි ගොනුව පරික්ෂා කර ඔහුගේ චර්යාව පිළිබඳ සලකා බලා ප්‍රතිකාරය සඳහා ඇතුළත් කරගන්නේ ද නැතිනම් වෙනත් පුනරුත්තාපන මධ්‍යස්ථානයක් වෙත යොමු කරන්නේ ද යන්න තීරණය කිරීම අදාල නිලධාරියා සතු වේ. (පූර්ව හැසිරීම් සලකා බැලූ විට එම මධ්‍යස්ථානය තුළ නේවාසික වීමෙන් සේවාලාභියාගේ ප්‍රතිකාරයේ ඵලදායීතාවය අඩු වන බව පෙනීයන්නේ නම් පමණක්)
- සේවාලාභියෙකු සඳහා කෙතරම් පූර්ව උපදේශන සැසි ප්‍රමාණයක් අවශ්‍ය වේදැයි යන්න සේවාලාභියාගේ ස්වභාවය අනුව තීරණය වේ.
- කිසිදු උපදේශන සැසියක් තුළදී නේවාසික කරගැනීම සඳහා බලහත්කාරී මැදිහත්වීම් සිදු නොකල යුතුය.

- පූර්ව උපදේශන සැසිය අවසානයේ නැවත උපදේශනය සඳහා හෝ නේවාසික ප්‍රතිකාරය සඳහා දිනයක් ලබා දීමට සැලකිළිමත් විය යුතු ය.

### 5.3.1. සේවාලාභියා සමග පූර්ව උපදේශනය.

- සේවාලාභියා ආයතනය වෙත යොමු වුයේ ස්වකැමැත්ත ඇතිව ද, නැතහොත් බාහිර බලපෑමක් මත ද යන්න උපදේශකවරයා විසින් අවබෝධ කර ගත යුතු වේ.
- ආයතනයේ උපදේශන පත්‍රිකාව තුල සියලු තොරතුරු සටහන් කර ගත යුතු වේ.
- මත්ද්‍රව්‍යය භාවිතයේ ස්වභාවය (මුල් භාවිතය, භාවිත ඉතිහාසය, භාවිත අත්දැකීම්, පූර්ව ප්‍රතිකාරභාවිතා කරන ක්‍රමෝපායන්) නීතිමය තත්ත්වයන්, කායික රෝග, මානසික රෝග, සමාජීය තත්වයන්, පිළිබඳ සියලු තොරතුරු නිවැරදි ලෙස හදුනා ගෙන සටහන් තබා ගැනීම අනිවාර්ය වේ.
- සේවාලාභියෙකු පූර්ව උපදේශනය තුල දී සම්මත අනාවරණ පරීක්ෂාවක් සිදු කර එම සේවාලාභියා බාහිර සේවාවන් වෙත යොමු කරන්නේ ද, උපදේශන මැදිහත් වීමක් පමණක් සිදු කරන්නේ ද, නේවාසික ප්‍රතිකාරය සඳහා යොමු කරන්නේ ද යන්න පූර්ව උපදේශනයේදී නිගමනය කර අදාල යොමු කිරීම සිදු කල යුතු වේ.
- සේවාලාභියා තුල විරමණ අපහසුතා පිළිබඳ බියක් පවතින්නේ යයි හදුනාගත හොත් ඊට මුහුණ දීමට අවශ්‍ය මානසික සූදානම සැකසීම.
- ස්වයං මැදිහත් වීම - වෙනස් විය යුතු දේ හදුනා ගැනීමට යොමු කරවීම.
- සේවාලාභියා තුල භාවිතයෙන් නිදහස් වීමට චේතනාවක් ගොඩනැගීම.
- නැවත උපදේශනය සඳහා පැමිණෙන දිනයේ දී,
  - භාවිත ප්‍රමාණය අවම කර ගැනීම
  - භාවිත කාලය තුල තමාට වූ අහිමි වීම් හා හිමිවීම් පිළිබඳ ලිඛිත පැවරුම්
  - විරමණ ලක්ෂණ මග හරවා ගැනීමේ පැවරුම්
  - ඖෂධ මත යැපෙන්නේ නම් එය අවම කර ගැනීම

යන කරුණු සඳහා මග පෙන්වීම සිදු කළ යුතු ය.

- සේවාලාභියාට යම් කායික රෝගී තත්ත්වයක් හෝ වෙනත් මානසික රෝගී තත්ත්වයක් ඇතොත් ඊට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට උපදෙස් ලබා දෙන්න.
- සේවාලාභියා හට මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක ප්‍රතිකාර වැඩසටහන, ප්‍රතිකාර කාල සිමාව හා ආයතනයේ නීති රීති පිළිබඳ කිසිදු කරුණක් නොසගවා පූර්ව අවබෝධයක් ලබා දිය යුතු ය.
- පූර්ව උපදේශනයේදී නේවාසික ප්‍රතිකාරය සඳහා යොමු වන සේවාලාභියාගේ මානසික හා කායික ගැටළු තිබෙන බව නිරීක්ෂණය වුවහොත් එම ගැටළු විසදා ගැනීමට බාහිර පාර්ශවයන් වෙත යොමු කිරීමට අවධානය යොමු කළ යුතු ය.
- භාරකරුවෙකු නොමැති අවස්ථාවක සේවාලාභියකු නේවාසික ප්‍රතිකාරය සඳහා යොමු කරන්නේ නම්, අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ග්‍රාම නිලධාරීවරයාගේ සහතිකයක් රැගෙන එන ලෙස දැනුම් දීම.

### 5.3.2. භාරකරුවන් සමග පූර්ව උපදේශනය

- භාරකරුවන් සමග පූර්ව උපදේශනයේදී සේවාලාභියාගේ වත්මන් තත්ත්වය හා මත්ද්‍රව්‍යය භාවිත ඉතිහාසය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සිදු කල යුතු වේ. මේ පිළිබඳ කරුණු සාකච්ඡා කිරීමේ දී සේවාලාභියාගේ පෞද්ගලිකත්වය සුරැකෙන ලෙස අදාල නිලධාරියා කටයුතු කළ යුතු ය.
- භාරකරුවන් හට මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක ප්‍රතිකාර වැඩසටහන, ප්‍රතිකාර කාල සීමාව හා ආයතනයේ නීති රීති පිළිබඳ අවබෝධය ලබා දිය යුතුය.
- සේවාලාභියාගේ විරමණ අපහසුතා කළමණාකරණය කර ගැනීමට සහය වීමට අවශ්‍ය අවබෝධය භාරකරුවන් හට ලබා දිය යුතු වේ.
- අවශ්‍යතාවය අනුව බාහිර සේවා වෙත සම්බන්ධ කිරීම.
- පසුරැකවරණ ක්‍රියාවලියට යොමු කිරීම. (නේවාසික නොවන සේවාලාභින් සඳහා)
- නිසැකවම භාවිතය නතර කළ හැකි බවට නිරන්තරයෙන් ආත්ම විශ්වාසය ගොඩනැගීමට උපදෙස් ලබා දෙන්න.
- බිරිද හෝ ළගම ඥාතියකු මනෝවිද්‍යාත්මක මැදිහත්කරු ලෙස කටයුතු කිරීමට අවශ්‍ය පෙළඹවීම ලබා දීර්ට අවශ්‍ය පුහුණුව ලබා දිමට කටයුතු කරන්න.

## 6. සේවාලාභීන් නේවාසික ප්‍රතිකාර සඳහා ඇතුළත් කිරීම

මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ තැනැත්තෙකුට හෝ තැනැත්තියකට ඉන් නිදහස් වීම උදෙසා මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන ආයතන තුළ ප්‍රතිකාර සේවාවන් සපයනු ලබයි. පූර්ව උපදේශනයේදී ගනු ලබන එකඟතාවයන් හෝ සේවාලාභියාගේ සහ ප්‍රතිකාර කාර්ය මණ්ඩල නිලධාරියාගේ එකඟතාවය මත නේවාසික ප්‍රතිකාරයට නිර්දේශ වූ අයෙකු නියමිත ප්‍රතිකාර කාලයකට පුනරුත්ථාපන ආයතනයක් වෙත ඇතුළත් කර ගනු ලබයි. එහිදී සේවාලාභියාගේ අයිතිවාසිකම් සුරැකෙන පරිදි ගුණාත්මක ප්‍රතිකාර සේවාවක් ඔහු හෝ ඇය වෙත ලබා දීම උදෙසා පහත සඳහන් කරුණු අනුගමනය කිරීම කළ යුතුය.

- සේවාලාභීන් සුහදව පිළිගැනීම සහ නේවාසික ප්‍රතිකාරයට ඇතුළත් කිරීම සඳහා සූදානම් කිරීම.
- උපදේශන පත්‍රිකාව (ඇමුණුම -01)/ජීව දත්ත සටහන (ඇමුණුම -02 )/සේවාලාභී තක්සේරු වාර්තාව (ඇමුණුම - 03) සම්පූර්ණ කිරීම.
- සේවාලාභියා ශාරීරික පරීක්ෂාවට ලක් කිරීම.
- නේවාසික සේවාලාභියා සඳහා ප්‍රතිකාර ලිපිගොනුවක් විවෘත කිරීම.
- නේවාසික සේවාලාභියා විසින් පිළිපැදිය යුතු කොන්දේසි මාලාව සහ පොරොන්දුමාලාව සේවාලාභියාට ඉදිරිපත් කර එකගතාවය ගැනීම - (ඇමුණුම 04)
- නේවාසික වීමට පෙර සේවාලාභියා සතු මුදල් හා භාණ්ඩ තිබේ නම්, භාරකරුවන්ට පැවරීම. භාරකරු නොමැති නම්, අදාල ආයතනයේ නිලධාරීන් විසින් සාකච්ජා කර යෝග්‍යය තීරණයක් ගැනීම.
- පූර්ව උපදේශනයේදී වෛද්‍ය වාර්තාවක් අවශ්‍ය බව දැනුවත් කර ඇති සේවාලාභීන්ගේ (පූර්ව උපදේශනයේදී සේවාලාභියාගේ සෞඛ්‍ය තත්ත්වය නේවාසික ප්‍රතිකාරයක් සඳහා සුදුසු තත්ත්වයක පවතී දැයි තහවුරු කර ගත යුතු බව හැගී යාම මත) සෞඛ්‍යමය තත්ත්වය පිළිබද වෛද්‍ය වාර්තාව ලබා ගැනීම - (ඇමුණුම-05)

- සේවාලාභියාට යම් හඳුනාගත හැකි රෝගී තත්ත්වයක් ඇති බවට සැක කරන්නේ නම්, ඇතුළත් කිරීමට අදාල වෛද්‍ය නිර්දේශයන් අවශ්‍යය, සේවාලාභීන් ළගම ඇති රජයේ රෝහලට හෝ වෛද්‍ය සේවා සපයන ආයතනයකට යොමුකළ යුතුවේ. සේවාලාභීන් මානසික රෝග හෝ හෙපටයිටිස්, එච්. අයි. වී., ක්ෂය රෝගය ආදී බෝවන රෝග වැළඳී ඇත්දැයි බැලීමට වෛද්‍ය පරික්ෂාවන් සඳහා යොමු කළ යුතුය. සේවාලාභියා ඉහත සඳහන් රෝගයකින් පෙළෙන බව අනාවරණය වුවහොත් භාරකරුවන්ගේද සහය ඇතිව ඔහු/ඇය වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුකළ යුතුය. වෛද්‍ය නිර්දේශ මත පදනම්ව නේවාසික ප්‍රතිකාර වැඩසටහන් තුල තව දුරටත් සේවාලාභියා රඳවා තබා ගත හැකිද යන්න ප්‍රතිකාර කාර්ය මණ්ඩලය විසින් තීරණය කල යුතුය. කෙසේ නමුත් මෙම සේවාලාභීන් සඳහා අඛණ්ඩ උපදේශන ප්‍රතිකාර සහ පසුරැකවරණ සේවා සැලසුම් කල යුතුය.
- රට තුළ උද්ගත වන ආරක්ෂකමය, සෞඛ්‍යමය හෝ වෙනත් විශේෂ තත්ත්වයන් තුළදී ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදය වෙනස් විය හැකිය. එහිදී එම තත්ත්වයට අදාළව රජය නිකුත් කරනු ලබන නිර්දේශ හා මාර්ගෝපදේශ පදනම්ව ඇතුළත් කිරීම්, ප්‍රතිකාරය පවත්වාගෙන යාම සහ බැහැර කිරීමට අදාළව කටයුතු සිදු කළ හැකිය. තවද එවැනි අවස්ථාවක මධ්‍යස්ථාන වල පවතින සම්පත් හා පහසුකම්හි ස්වභාවය මත ප්‍රතිකාර සේවා සැපයීම සිදු කරන ආකාරය මධ්‍යස්ථානය මඟින් තීරණය කරනු ලබයි.

සේවාලාභියෙකු ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළත් කර ගැනීමේදී අනුගමනය කරනු ලබන ඉහත ක්‍රියාමාර්ග තුළින් සේවාලාභියා ප්‍රතිකාරයට ඇතුලත් කර ගැනීම සඳහා ඇති කායික, මානසික හා චිත්තවේගීය යෝග්‍යතාවය පරීක්ෂා කිරීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව සේවාලාභියා නේවාසික ප්‍රතිකාරයට ඇතුළත් කර ගන්නේ නම්, ඉදිරි කටයුතු සඳහා ආයතනයේ උපදේශකවරයා වෙත යොමු කළ යුතුය.

# 7. ප්‍රතිකාර ක්‍රියාවලිය

## 7.1. ප්‍රතිකාර ක්‍රියාවලිය හැඳින්වීම

මත්ද්‍රව්‍යට ඇබ්බැහි වූ පුද්ගලයෙකුට ඉන් නිදහස්වීමේදී ඇති වන කායික හා මානසික අපහසුතා කළමනාකරණය කර ගනිමින් ප්‍රජානනාත්මකව හා චර්යාත්මකව ඇති කර ගන්නා වෙනසක් මත මත්ද්‍රව්‍යයෙන් නිදහස් වීමට මනෝවිද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක පදනමකින් සිදු කරන සහාය ලබා දීමේ ක්‍රියාවලියක් ලෙස මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්තාපන ක්‍රියාවලිය හඳුනා ගත හැකිය. ඒ සඳහා ලෝකය තුළ සාර්ථක ලෙස භාවිතා කරන ක්‍රමවේද කිහිපයක් හඳුනාගත හැකිය.

**වර්තමානයේ ලෝකයේ ප්‍රධාන වශයෙන් භාවිත ප්‍රතිකාර ආකෘති (model) කිහිපයක් හඳුනාගත හැක.**

1. මනෝවිද්‍යාත්මක ආකෘතිය (PsychologicalModel)
2. ප්‍රතිකාරාත්මක ප්‍රජාවන් (Therapeutic Community)
3. ඖෂධ සහයක ප්‍රතිකාර ක්‍රම (Medical Assistance Therapy)
4. ජීව භෞතික (Biophysical)
5. දෙළොස් පියවර පහසුකම් සැලසීමේ ප්‍රතිකාරය (Twelve Stapes Facility Therapy)
6. ආගම් පදනම් වු ආකෘති (Faith Based Model)
7. සාම්ප්‍රදායික ක්‍රම (Traditional Healing)

ඉහත සඳහන් ප්‍රතිකාර ආකෘති ප්‍රධාන වශයෙන් මත්ද්‍රව්‍යට ඇබ්බැහි වූ සේවාලාභීන්ගේ ප්‍රතිකාර සඳහා භාවිතා කරන අතර ඒ අතරින් මනෝවිද්‍යාත්මක ආකෘතිය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථානයන් තුළ භාවිතා කරනු ලබන ප්‍රතිකාර ක්‍රමවේදයයි. යම් ආයතනයක් කවර ප්‍රතිකාර අකෘතියක් භාවිතා කලද සේවාලාභියාගේ මත්ද්‍රව්‍යයපිළිබඳ ඇති

සංජානනය වෙනසකට ලක් කිරීමෙන් බැඳීම ශූන්‍යත්වයට පත් කිරීම සඳහා අවධානය යොමු කළ යුතුය.

පුද්ගලයන් මත්ද්‍රව්‍ය, භාවිතයට යොමු වීමට කායික, මානසික සහ සමාජීය මෙන්ම තවත් සුවිශේෂී වූ කරුණු රාශියක් බලපානු ලබයි. පුද්ගලයා සමාජ සත්වයෙකු ලෙස කුඩා කාලයේ පටන් විවිධ ඉගෙනුම් සිදුකරනු ලබන අතර මත්ද්‍රව්‍ය, භාවිතය සම්බන්ධයෙන් වැරදි ආකල්ප ගොඩනගා ගනී. මත්ද්‍රව්‍ය පිළිබඳව ගොඩනගා ගත් වැරදි විශ්වාස පද්ධතිය (සංජානනය කරගත් ආකාරය) නිවැරදි කරවීම සහ ඒ හා බැඳුනු චර්යාවන්, සමාජ ක්‍රියාකාරකම් වෙනස් කර ගැනීමට අවස්ථාව සලසා දීම තුළින් ඔවුන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් කර ගැනීම ප්‍රතිකාරයෙන් අපේක්ෂා කරයි.

පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ ප්‍රතිකාර ක්‍රියාවලිය තුළදී ප්‍රධාන වශයෙන්ම භාවිතා කරන මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රම ශිල්පය වන්නේ ප්‍රජානන චර්යාත්මක ප්‍රතිකාර ක්‍රම ශිල්පයයි (CBT Techniques). ඒ යටතේ සේවාලාභියා තුළ මත්ද්‍රව්‍ය පිළිබඳව පවතින චින්තනය හා චර්යාවන් වෙනස් කරගනිමින් ඔහුගේ ප්‍රජානනය ධනාත්මකව වෙනස් කිරීමට උපදේශන මැදිහත්වීම් කරනු ලබයි.

මත්ද්‍රව්‍ය භාවිත සේවාලාභීන් සඳහා ප්‍රතිකාර කිරීමේදී, මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රියාවලිය තුළ පහත සඳහන් මූලිකාංගයන් පිළිබඳව අවධානයක් යොමු කරයි.

- මත්ද්‍රව්‍ය හා මත්ද්‍රව්‍ය භාවිතය පිලිබඳ ආකල්පමය වෙනසක් ඇති කිරීම.
- සේවාලාභියා නව චර්යාවකට හැඩගැස්වීම.
- සේවාලාභීයාගේ අතීත අත්දැකීම් නැවත පරීක්ෂණයට භාජනය කිරීමට උදව් කිරීම තුළින් ඔහු තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගොඩනැඟී ඇති වැරදි සංජානනය වෙනස් කිරීම.
- මත්ද්‍රව්‍ය උප සංස්කෘතිය සහ එහි ස්වභාවය තේරුම් ගෙන එහි බලපෑමට හසු නොවී සිටීමට සේවාලාභීයාට උදව් කිරීම හා ඔහු තුළ මානසික ප්‍රතිශක්තිය බලගැන්වීම.
- සේවාලාභීයාගේ පවුලේ ළගම සමාජිකයන් සහ අනිකුත් තීරණාත්මක පුද්ගලයන් අතර සම්බන්ධතා දියුණු කර නැවත භාවිතයට යොමු වීම වැළැක්වීම.
- මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ වෙනත් පුද්ගලයින් ඉන් නිදහස් කිරීමට අවශ්‍ය මැදිහත්වීම සඳහා මත්ද්‍රව්‍යයෙන් නිදහස් වූ සේවාලාභින්ගේ සහය ලබා ගැනීම.

## 7.2. විරමණ අපහසුතා කළමණාකරණය

මත්ද්‍රව්‍යය භාවිතය නතර කිරීමේදී ඇතැම් සේවාලාභීන් විරමණ අපහසුතා පෙන්නුම් කරයි. එහි ස්වභාවය සේවාලාභීන්ගේ කායික හා මානසික තත්ත්වය අනුව විවිධ වේ. ඒ සඳහා මනෝසමාජීය සහය ලබා ගනිමින් සේවාලාභියා තුළ පවතින බිය නැති කිරීමට සහාය වන ක්‍රියාවලියක් මෙහිදී සිදු කරනු ලැබේ (ඇමුණුම -06). නමුත්, හඳුනා ගන්නා ලද සුවිශේෂී අවස්ථාවන් වලදී පමණක් ඊට අවශ්‍ය වෛද්‍ය උපදෙස් මත කටයුතු කරනු ලබයි.

# 8. සේවාලාභීන්ගේ අයිතිවාසිකම් හා වගකීම්.

## 8.1. සේවාලාභින්ගේ අයිතිවාසිකම්.

- ආගම, ජාතිය, කුලය, දේශපාලනය හා විශ්වාස ගැන නොසළකා ප්‍රතිකාර සේවා ලබා ගැනීම.
- මත්ද්‍රව්‍ය වලින් තොර උපකාරාත්මක වාතාවරණයක් තුළ සේවාලාභින්ගේ ගරුත්වය සහ සුරක්ෂිතභාවය රැකෙන පරිදි ප්‍රතිකාර සේවා ලබා ගැනීම.
- සේවාලාභීන්ට හා ඔවුන්ගේ ඥාතීන්ට ප්‍රතිකාරයේ ස්වභාවය සහ එහි අන්තර්ගතය මෙන්ම ප්‍රතිකාරයෙන් අපේක්ෂිත ඉලක්ක සහ අවදානම් තත්ත්වයන් පිළිබඳව තොරතුරු දැනගැනීම.
- ඇතුළත් කිරීමට පෙර අනුමත තත්ත්වයන් සහ සීමාවන් ගැන දැනුවත්භාවය ලබා ගැනිම.
- පවුලේ සමාජිකයන් හෝ උපකාරක පුද්ගලයන්ට ප්‍රතිකාර කාල සීමාව තුළදී ආයතනයේ අවසරය මත සේවාලාභීන් හමුවීමට හැකි වීම.
- සමබල ආහාර වේලක් ලබා ගැනීම.
- රෝගී තත්ත්වයන් ඇති වු විට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම.

## 8.2. සේවාලාභීන් සදහා පුනරුත්තාපන ආයතනයක් තුළ බල පැවැත්වෙන කොන්දේසි.

සේවාලාභින්ගේ හා භාරකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමත් මධ්‍යස්ථාන ක්‍රියාවලිය විධිමත්ව පවත්වාගෙන යාමත් සදහා පහත සඳහන් කොන්දේසි පිළිපැදීම සේවාලාභියාගෙන් අපේක්ෂා කරයි.

- මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන මත්ද්‍රව්‍ය වලින් තොර වන අතර කිසිදු මත්ද්‍රව්‍යක් භාවිතා කිරීමට අවස්ථාවක් නොමැත.
- සියලු මත්ද්‍රව්‍ය භාවිතා කිරීම ළග තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම් ය. එසේ සිදු කළ හොත් ඊට අදාල විනය ක්‍රියාමාර්ග ගැනීමට ආයතනයට හැකියාව පවතී.
- සේවාලාභීන් සතු බඩු බාහිරාදිය ඕනෑම වේලාවක පරීක්ෂා කිරීමේ අයිතිය කාර්යය මණ්ඩලය සතු වේ.
- හිංසාකාරී ලෙස හැසිරීම සහ අසභ්‍ය වචන භාවිතය සම්පූර්ණයෙන්ම තහනම් වේ.
- ප්‍රතිකාර වැඩසටහන් වලට ගැළපෙන අයුරින් සුදුසු ඇඳුමකින් සැරසීම සේවාලාභීන්ගේ වගකීම වේ.
- සේවාලාභීන්ගේ කොණ්ඩය සහ රැවුල මනාව පවත්වා ගත යුතුය.
- අවදිවීම, ආහාර ගැනීම, නින්දට යාම ප්‍රතිකාර වැඩසටහන් රැස්වීම් උපදේශන වැඩසටහන් හා සම්බන්ධ නීති රීති පිළිපැදීම අනිවාර්ය වෙයි.
- මධ්‍යස්ථානයේ ගොඩනැගිලි, නිදන කාමර, භෝජනාගාර, මුලුතැන්ගෙය, වැසිකිලිය, නාන කාමර සහ වත්ත පිරිසිදුව ආරක්ෂාකාරීව සහ අලංකාරාත්මකව තබා ගැනීම සේවාලාභීයන් විසින් ඉටු කල යුතු ය.
- ජලය සහ විදුලිය අරපිරිමැස්සමෙන් පරිහරණය කිරීම සිදු කළ යුතුය.
- සේවාලාභීන් බැලීමට පැමිණෙන පවුලේ සාමාජිකයන් සහ අනෙකුත් අමුත්තන් සඳහා මධ්‍යස්ථානය විසින් නිර්දේශ කරන ලද නීති රීති පිළිපැදිය යුතු වේ.
- ප්‍රතිකාර කාර්යමණ්ඩලය සමඟ සුහද සම්බන්ධතාවයක් ඇතිකරගත යුතු අතර කාර්ය මණ්ඩලය අපහසුතාවයට පත්වන අයුරින් නොහැසිරිය යුතුය.

## 8.3. පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් තුළ කාර්ය මණ්ඩලයට අදාල ආචාර ධර්ම සංග්‍රහය

ප්‍රතිකාර කාර්ය මණ්ඩලයේ මූලික වගකීම වන්නේ මධ්‍යස්ථානගත සේවාලාභීන්ට ලබා දෙන සේවාවන්හි ගුණාත්මක බව තහවුරු කිරීමයි. ඒ නිසා යහපත් ප්‍රතිකාරාත්මක සම්බන්ධතාවයක් පවත්වාගෙන යායුතු වෙයි. ආචාර ධර්ම වැදගත් වන්නේ ඒ සඳහාය. කාර්ය මණ්ඩලය සහ සේවාලාභීන් අතර සම්බන්ධතාවය වෘත්තීමය එකකි. මෙම වෘත්තීමය සම්බන්ධතාවය යහපත් ලෙස

පවත්වාගෙන යාමට සහ මතුවන ගැටලු නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට සමස්ත කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක්ම පහත සඳහන් ආචාර ධර්ම පද්ධතිය ආරක්ෂා කළ යුතුය.

- සුහදශීලීව ආයතනයට පිළිගැනීම සිදු කළ යුතුය.
- කඩිනමින් සේවාවන් සැපයීම සිදු කළ යුතුය.
- ආයතනයට පැමිණෙන සේවාලාභීන් තෘප්තිමත් වන ආකාරයෙන් සේවාවන් සැපයීම සිදු කළ යුතුය.
- දුරකථනය මගින් සේවාවන් සැපයීමේදී ප්‍රියමනාප ලෙස ප්‍රතිචාර දැක්වීම හා නිරවද්‍ය තොරතුරු කඩිනමින් හා වගකීමෙන් ලබාදීම සිදු කළ යුතුය.
- සේවාලාභින් බඳවා ගැනීමේදී පොරොත්තු ලේඛණයට අනුවම බදවා ගැනීම හා අදාළ දිනයේම සේවාලාභියා මුදා හළ යුතුය.
- සේවාලාභීන්ට නිවැරදි තොරතුරු ලබාදී නේවාසික කරගත යුතුය.
- ජාති, කුල, ආගම්, වර්ණ,භාෂාව හා ප්‍රාදේශීය ආදී කිසිවක් සැලකිල්ලට නොගෙන සියලු දෙනාටම සමව සේවාවන් සලසා දිය යුතුය.
- සේවාලාභීන්ගෙන් ලබාගත් සෑම තොරතුරක් පිළිබඳව රහස්‍යභාවය සහ පුද්ගලිකත්වය සුරැකියයුතුය.
- විශ්වාසනීයත්වය ආරක්ෂා කළයුතුය.
- සේවාලාභීන්ගේ ගෞරවය ආරක්ෂා වන පරිදි කටයුතු කළයුතුය.
- සේවාලාභියාගේ ලිඛිත අවසරයකින් තොරව ඔහුගේ ඡායාරූප වීඩියෝ පට ලබා ගැනීම හෝ ප්‍රසිද්ධ කිරීම නොකළ යුතු ය.
- සේවාලාභීන් සමඟ අයථා සම්බන්ධතා නොපැවැත්විය යුතුය.
- අල්ලස් ලබා ගැනීම නොකළ යුතුය.
- සේවාලාභීන්ගේ කිසිවක් පුද්ගලික ප්‍රයෝජනයට ලබා නොගත යුතුය.
- තමන්ගේ හෝ කාර්ය මණ්ඩලයේ ලාභ ප්‍රයෝජන උදෙසා සේවාලාභීන් යොදා නොගත යුතුය.
- සේවාලාභීන් හිංසනයට ලක් නොකළ යුතුය.
- සේවාලාභීන් ඇමතීමේදී ඔහුගේ නම භාවිතා කළ යුතුය.

- සේවාලාභින්හට ආහාර, ජලය හා  වැසිකිලි පහසුකම් නොදී සිටීම නොකළ යුතුය.
- ප්‍රතිකාර වැඩසටහන ගුණාත්මක කිරීම සඳහා කාර්ය මණ්ඩලය ප්‍රතිකාර රැස්වීම්වලදී ගනු ලබන පොදු එකඟතාවලට ගරු කිරීම හා ඉටු කිරීම කළ යුතුය.
- තම සිතැගි පරිදි නොව ප්‍රතිකාර අත්පොත හා මාර්ගෝපදේශන සංග්‍රහය අනුව රාජකාරී කළ යුතුය.
- සේවාලාභීන්හට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර කඩිනමින් ලබාදීම හා ඖෂධ නිසිවේලාවට ලබාදීම කළ යුතුය.
- බෝවන රෝග ඇතුළු රෝග සහිත සේවාලාභීන් ආන්තීකරණයට ලක් නොකළ යුතුය.
- නවක නිලධාරීන් හා පුහුණු නිලධාරීන් සේවාලාභීන් සමඟ කටයුතු කිරීමේදී අවශ්‍ය මඟ පෙන්වීම ලබාදිය යුතුය.

## 8.4. සේවාලාභීන්ගේ විනය පාලනය.

යම් සේවාලාභියෙකුගේ හැසිරීමක් මත කාර්ය මණ්ඩලය හෝ වෙනත් සේවාලාභීන් කායිකව හෝ මානසිකව හිංසනයට ලක්වෙයි නම් හෝ යම් සේවාලාභියෙකු සම්මත විනය පටිපාටිය උල්ලංඝනය කරයි නම්, සේවයේ නියුතු කාර්ය මණ්ඩලය විසින් එම තත්ත්වය සමථයකට පත් කිරීම සඳහා කටයුතු කළ යුතුය. එකී හැසිරීම සඳහා මැදිහත්වීමෙන් අනතුරුවද ගැටළුකාරී තත්ත්වය තවදුරටත් අඛණ්ඩව පවතින බව නිරීක්ෂණය වේ නම්, ප්‍රතිකාර කාර්ය මණ්ඩලය තුළ ගැටළු සාකච්ඡා කිරීමෙන් අනතුරුව අදාළ සේවාලාභියා වෙනත් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට මාරු කර යැවීම, විකල්ප ප්‍රතිකාර ක්‍රම කෙරෙහි යොමු කිරීම, රටෙහි සාමාන්‍ය නීතීය අනුව කටයුතු කිරීම යන ක්‍රියාමාර්ග කෙරෙහි යොමු වීමට ආයතනයට හැකියාව පවතී.

# 9. සේවාලාභීන් තුළ මත්ද්‍රව්‍ය පිළිබඳ ආකර්ෂණය සහ බැඳීම ශූන්‍ය කරන ආකාරය

## 9.1 හැඳින්වීම

මත්ද්‍රව්‍යයෙන් නිදහස් වීම කරා යොමු වීමේ දී, මත්ද්‍රව්‍යය වල ඇති හිස් බව (ශූන්‍ය බව), ප්‍රයෝජනයක් නැති බව හා භාවිතයේදී ඇති වන අප්‍රසන්න, වේදනාකාරී තත්වයන් පිළිබඳ ස්වයං ඥානාවබෝධය ඇති වීමට පෙළඹවීම ප්‍රතිකාර ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්‍යයකි.

මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ අයෙකු කායික, මානසික, මනෝ සාමාජීය හා අධ්‍යාත්මිකව සැලකිය යුතු පරිහානියකට, කඩා වැටීමකට පත් වේ. ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහනකින් ඉහත සඳහන් කරුණු වල සාධනීය දියුණුවක් (වර්ධනයක්) ඇති කරනු ලබයි.ඒ සමඟම මත්ද්‍රව්‍යය වලින් නිදහස් වීම සඳහා පුද්ගලයා තුල මත්ද්‍රව්‍යය භාවිතය ආශ්‍රිතව ගොඩනැගී ඇති වැරදි ඉගෙනුම් පද්ධතිය හේතුවෙන් මත්ද්‍රව්‍යය භාවිතය ආශ්‍රිත සමස්ථ ක්‍රියාවලියට බැඳීමක්, ආශාවක්, කැමැත්තක්, ගිජු බවක් ගොඩනගා ගෙන ඇත.ඊට සමගාමීව වැරදි චර්යාවන් සමූහයකටද බැඳී සිටී. එම වැරදි සහගත සංජානනයන් නිවැරදි කර භාවිතයට ඇති බැඳීම ශූන්‍ය කිරීම තුලින් පුද්ගලයා ව මත්ද්‍රව්‍යයෙන් නිදහස් අයෙකු බවට පත් වේ.

## 9.2. මත්ද්‍රව්‍යය සඳහා ආකර්ෂණය සහ බැඳීම ගොඩනැගෙන ආකාරය

පහත පාර්ශ්වයන්ගේ ක්‍රියාකලාපය නිසා මත්ද්‍රව්‍යය භාවිතය පිළිබඳ වැරදිවිශ්වාස පද්ධතියක් ගොඩනැගෙයි. එම නිසා එයට ආකර්ශනයක්, වටිනාකමක් ඇති වෙයි. එහි ප්‍රතිඵලය වනුයේ මත්ද්‍රව්‍ය කෙරෙහි බැඳීම ජනිත වීමයි.

- මත්ද්‍රව්‍යයෙන් සතුටක්, ආශ්වාදයක් ඇති වෙනවා.

- මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ වැරදි මත, ප්‍රකාශ හා හැසිරීම්.
- සම වයස් කණ්ඩායම් වල වැරදි මත, ප්‍රකාශ හා හැසිරීම්.
- මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, අලෙවිකරුවන්ගේ වැරදි මත ප්‍රකාශ, ක්‍රියාකාරකම් හා කූට උපක්‍රම
- ජන මාධ්‍ය වල හැසිරීම.
- මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර සේවාවන් සපයන්නන්ගේ සමහර වැරදි හැසිරීම, හා ක්‍රියාකාරකම්.
- දුර්වල රාජ්‍ය ප්‍රතිපත්ති, අණපනත්.
- භාවිත නොකරන්නන්ගේ වැරදි මත,ප්‍රකාශ හා හැසිරීම්
- නිදහස් වීමට ඇති බිය සමග මතු වන හැසිරීම්.

## 9.3. මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් මේ වන විට සමාජය තුළ ගොඩ නැගී ඇති වැරදි මතවාද කිහිපයක්

1. මහන්සි වෙලා වැඩකරන්න පුළුවන්
2. මත්ද්‍රව්‍ය බිව්වහම නිර්මාණශීලී වෙනවා
3. මත්ද්‍රව්‍ය බිව්වහම මතකය වැඩිවෙනවා
4. මත්ද්‍රව්‍ය බිව්වහම කටහඬ මිහිරි වෙනවා
5. මත්ද්‍රව්‍ය බිව්වහම පාඩම් කරන්න පුළුවන්
6. මත්ද්‍රව්‍ය බිව්වහම ලස්සන වෙනවා
7. මත්ද්‍රව්‍ය වලට නිදි මරන්න පුළුවන්
8. ලිංගිකත්වයට හොඳයි
9. කල්පනා කරන්න පුළුවන්.
10. ප්‍රශ්න වලට මුහුණ දෙන්න පුළුවන්.
11. කෙළින් කතා කරන්න පුළුවන්.
12. වෙලාව ගතවෙනවා දැනෙන්නේ නෑ.

13. ඇඟට (Fit) එකක් දැනෙනවා,

14. කිසිම ලෙඩක් හැදෙන්නේ නෑ.

15. භය නැති වෙනවා, ඕන රෑක තනියෙන් යන්න පුළුවන්.

16. හොඳට කෑම කන්න පුළුවන්.

17. සමාජශීලී වෙන්න පුළුවන්.

18. ඇඟපත වේදනාව නැති වෙනවා.

19. විනෝද වෙන්න පුලුවන්.

20. දුක නැති කරන්න හොදයි


## 9.4. භාවිතයෙන් නිදහස් වීම සඳහා චර්යාත්මක වෙනස්කම්

මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ අයෙකු සමස්ථ භාවිත ක්‍රියාවලිය තුළ රැඳී සිටීමත් සමඟ ඔහුගේ ජීවන රටාවේ තිබූ යහපත් දෑ ඉවත් වීම හෝ අවම වීමක් සිදුවේ. තම ජීවන රටාවට අයහපත් දේ එකතු වීම හේතු කොටගෙන භාවිතයට රුකුල් දෙන චර්යාවකට හුරු පුරුදු වෙයි. එම චර්යාවන් වෙනස් කරගැනීම, ඔහුට මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් වීම සඳහා උපකාරී වේ.

- මත්ද්‍රව්‍ය පිළිබඳ වැරදි අදහස් මත ඇති සියලු දෙනා භාවිතයට නොයයි.
- භාවිතයට වටිනාකම් තිබුණත් එයට බැඳීමක් ඇති වන්නේ එය භාවිතා කිරීමත් සමඟය.
- කෙනෙකු භාවිතයේ රැඳී සිටින්නේ මත්ද්‍රව්‍යය භාවිතය ජීවන රටාව තුළට ඇතුල් වූ නිසාවෙනි.
- එම ජීවන රටාව ක්‍රමානුකූලව වෙනස් කිරීමෙන් බැඳීම අවම කළ හැකිය.
- වැරදි ලෙස ඉගෙනගත් දෑ නිවැරදි ලෙස අවබෝධ කර ගැනීමට සැලැස්වීම තුළින් මත්ද්‍රවය භාවිතය අප්‍රසන්න, නීරස, හිස් දෙයක් ලෙස දකියි.

## 9.5. භාවිතයෙන් නිදහස් වීම සඳහා සේවාලාභියෙකු විෂයෙහි සිදු කළ හැකි චර්යාමය මැදිහත් වීම් කිහිපයක්

- භාවිතය නිසා, පවුලට, රැකියාවට හා එදිනෙදා කටයුතු වලට ඇතිවන බාධා අවම කිරීමට පියවර ගැනීම.
- භාවිත ප්‍රමාණය, වෙලාව, අවස්ථා වෙනස් කිරීම.
- වරකට ගන්නා මාත්‍රාව අඩු කිරීම.
- දිනකට ගන්නා වාර ප්‍රමාණය වෙනස් කිරීම.
- කායික පවිත්‍රතාවය පිළිබඳ සැලකිලිමත් වීම. (උදා.-රැවුල, කොණ්ඩයපිළිවෙළකට කපා පිරිසිදුව සිටීම.)
- ආහාර පාන ගැනීම නිසි වේලාවට හා පිරිසිදුව ලබාගැනීම
- මත්ද්‍රව්‍ය භාවිතය නිසා සැබෑ ජීවිතයේදී ඔහුට අහිමි වන සතුට, විනෝදය පිළිබඳ හැඟීම් ඇති කිරීම.
- ගමන් බිමන් යන මාර්ග වෙනස් කිරීම. (උප සංස්කෘතිය මගහැරීම)
- ඇසුරු කරන, හමුවන පුද්ගලයන් වෙනස් කිරීම.
- මත්ද්‍රව්‍ය භාවිතා කරන මිතුරන් මගහැරීම සහ ප්‍රතික්ෂේප කිරීම




## 9.6. මත්ද්‍රව්‍ය අපේක්ෂාවන් අභියෝග කිරීම

පුද්ගල උපදේශන, කණ්ඩායම් උපදේශන, මනෝඅධ්‍යාපන හා කණ්ඩායම් සාකච්ඡා වලදී බැඳීම ශුන්‍ය කිරීම උදෙසා පහත අන්තර්ගතයන් භාවිතා කල හැකිය.

- මත්ද්‍රව්‍ය භාවිතයට ආශාව/කැමැත්ත/කෑදරකම/ගිජු බව අතිවූ අයුරු විග්‍රහ කිරීම.
- භාවිත අත්දැකීම මුල් කාලය/ පසු කාලය/ අපහසුව වේදනාව අප්‍රසන්න බව ඉස්මතු කර ගැනීම. (සේවාලාභියාගේ අතීත හා වර්ථමාන අත්දැකීම් විමර්ශනය කිරීම.)
- විරමණ අපහසුතා විග්‍රහය, එකී මානසික පදනම අවබෝධ කරගැනීම සහ එය කළමනාකරණය කිරීම.
- තවදුරටත් භාවිතයට රැවටිලාද, අහුවෙලාද යන්න ප්‍රශ්න කිරීම හා නැවත නොරැවටෙන පුද්ගලයකු බවට පත් කිරීම.
- මත්ද්‍රව්‍ය භාවිතය තම පංචේන්ද්‍රියන්ට සැබෑ ලෙස දැනුන ආකාරය ආවර්ජනයට සැලැස්වීම.
- තමා තවදුරටත් සමවයස් කණ්ඩායම්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ ඉත්තෙක් ලෙස සිටිනවාද ඉන් ස්වාධීන වෙනවාද යන්න ප්‍රශ්න කිරීම.
- භාවිතයෙන් පසු රසායනයේ බලපෑම හා උගත් චර්යාව විමසා බැලීම.
- භාවිතයෙන් නිදහස් වීමේදී දැනෙන පහසුව සැහැල්ලුව හා අභිමානය දැකීමට සැලැස්වීම.
- මත්ද්‍රව්‍ය ජාවාරම කෙරෙහි විරෝධාකල්පයක් මතු කර ගැනීමට අවශ්‍ය අවබෝධය ලබා දීම. (තම නිදහස හා ධනය ජාවාරම්කරුවන් විසින් අහිමි කිර ඇති බව)
- මතට ඇති බැඳීම නිරෝධය(නිදහස් වීම)කරා යෑමේ කැමැත්ත හඳුනා ගැනීම. ඒ සඳහා කැමැත්ත ඇති කිරීම.

## 9.7. මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි ඉගෙනුම් පද්ධතිය අභියෝග කරමින් භාවිතයට ඇති බැඳීම ශූන්‍ය කිරීම සඳහා යොදා ගත හැකි මනෝවිද්‍යාත්මක ප්‍රවේශයන්

ප්‍රතිකාර කාර්ය මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන මනෝඋපදේශන හා චිකිත්සන වැඩසටහන් වලදී පහත සඳහන් විවිධ ක්‍රම ශිල්පපිළිබඳ විශේෂ අවධානය යොමු කිරීම වැදගත් වනු ඇත.

- ප්‍රජානන චර්යා ප්‍රතිකාරය (සංයම අභ්‍යාස, පරිකල්පන අභ්‍යාස, භූමිකා රංගන, පැවරුම්)
- චර්යා හැඩගැන්වීමේ ප්‍රතිකාරය
- තාර්කික චිත්ත වේගි චිකිත්සාව(Rational Emotional Therapy)

- මනෝවිශ්ලේෂන චිකිත්සාව (Psycho Analysis)
- Trauma Inform Of Care (Trauma Counseling)
- සංයම අභ්‍යාස
- මෘදු කුසලතා සංවර්ධනය
- ක්‍රීඩා චිකිත්සාව
- අතීත අත්දැකීම් ප්‍රශ්න කිරීම් චිකිත්සාව (Therapies Of Reexamine The Past Expirience)
- උගත් හැසිරීම් නැවත ප්‍රතිගමන චිකිත්සාව(Reversal Therapy)
- ජීවන කුසලතා වර්ධනය කිරීමේ චිකිත්සාව(Life Skill)
- අභිප්‍රේරණ චිකිත්සාව (Motivational Therapy)
- ආවේගාත්මක චිකිත්සාව (Affect Therapy)
- ආත්ම අභිමානය ගොඩනැගීමේ චිකිත්සාව (Self Esteem Building Therapy)
- ආත්ම විශ්වාසය ගොඩනැගීමේ චිකිත්සාව (Self Confidence Building Therapy)
- කලා ප්‍රතිකාරය,සංගීත,චිත්‍ර,නාට්‍ය (Art Therpy)
- අර්බුද කළමණාකරණය (Crise Intervention)
- ස්නායු-භාෂාමයවැඩසටහන්කරණය (Nlp Therapy)
- සිද්ධී කළමණාකරණය (Case Management)

මනෝ අධ්‍යාපන වැඩසටහන් (Psycho Education Programme) වලට අමතරව පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ දැනුම අවබෝධය ගොඩනැගීම පිළිබඳව ද වැඩසටහන් සංවිධානය කිරීමේදී ඉලක්ක කර ගත හැකිය.

- මත්ද්‍රව්‍ය අපේක්ෂාවන් අභියෝග කිරීම.
- ප්‍රතිකාර වැඩසටහන ඇබ්බැහිය, විරමණ ලක්ෂණ, පසුරැකවරණ වැඩසටහන, නැවත භාවිතයෙන් වැළැක්වීම (Treatment Programme Addiction Withdrawal Symptoms After Care Programme"RelapsePrevention)
- යහපත් සෞඛ්‍ය පුරුදු හා සෞඛ්‍ය ප්‍රවර්ධනය.

- ලිංගික සම්ප්‍රේෂණ රෝග(HIV Aids)
- පවුල් හා සමාජ සම්බන්ධතා (ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා පිරිමිකම ගැහැණුකම අභියෝග කිරීම.)
- අධ්‍යාත්මික සංවර්ධනය
- රසවින්දනය හා කලාව
- පෞරුෂ සංවර්ධනය හා අනාගත සැලසුම්කරණය
- ජීවන කුසලතා සංවර්ධනය
- නායකත්වය හා කණ්ඩායම් සමඟ වැඩ කිරීම
- වෘත්තිය මර්ගෝපදේශනය
- නව තාක්ෂණික ලෝකයට මුහුණ දීම (අන්තර්ජාලය, ජංගම දුරකථන, වෙනත් මෙවලම් ජීවිතයට සහය කර ගත යුතු ආකාරය)
- සමස්ථ පරිසරය උදෙසා මානව දායාව වර්ධනය
- තත්ත්වය හා කාර්යය කොටස් පිළිබඳ  අවබෝධය
- ප්‍රථමාධාර, ආරක්ෂණ යාන්ත්‍රණය හා හැසිරීම.
- "සතිමත්බව" (Mind Fullness) වැඩසටහන්
- මත්ද්‍රව්‍ය නිවාරණය හා ප්‍රජා ප්‍රතිකාරය

## 10. දෛනික වැඩසටහන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම.

සේවාලාභීන්ගේ සංජානනයන් නව රටාවකට අනුව වෙනස් කර ගැනීමටත්, මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් ඵලදායි ජීවිතයක් ගත කිරිම සඳහා වන චර්‍යාවන් ගොඩනගා ගැනීමටත් උපකාරීවන අයුරින් පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ දෛනික වැඩසටහන සකස් වී ඇත. දෛනික වැඩසටහනේ සෑම අංගයක්ම ප්‍රතිකාරාත්මක අපේක්ෂාවක් සහිතව සැලසුම් වී ඇත.

උදෑසන අවදි වීමෙන් ප්‍රබෝධමත්බව සහ පහසුවෙන් දවස සැළසුම් කිරීමට හැකියාව ලැබේ. සරල ශාරීරික ව්‍යායාම හා යෝග අභ්‍යාස සේවාලාභියාගේ ශාරීරික ක්‍රියාශීලී බව ඇති කර ගැනීමට උදව් වන අතර ක්‍රියාශීලී ජීවිතයක් සඳහා මග පාදයි. තවද  කායිකව තමා දුර්වලය යන හැඟීම නැතිවේ. මානසික සංතෘෂ්ටිය සහ ප්‍රබෝධය ඇති කරගැනීම සඳහා පෞද්ගලික පිරිසිදුභාවය, අවට පරිසරය සහ නේවාසිකාගාරය පිරිසිදුව තබා ගැනීම වැදගත් වේ.

උදෑසන හමුව ප්‍රතිකාරාත්මක වැඩසටහනේ සුවිශේෂීම අංගයකි.උදෑසන හමුව කාර්යය  මණ්ඩලයේ සහභාගීත්වයෙන් සිදු විය යුතුය. එසේම සේවාලාභීන් සියලුදෙනා උදෑසන හමුවට සහභාගි වීම අපේක්ෂා කරයි. එමෙන්ම සේවාලාභීන් සිය ඉදිරිපත් කිරීම් සිදු කිරීමේදී සේවාලාභියාගේ සංවර්ධනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගැනීමට ප්‍රතිකාර කාර්ය මණ්ඩලයට අවස්තාව ලැබේ.

### 10.1. ප්‍රතිකාරාත්මක අගයක් සහිත උදෑසන හමුවකට සුදුසු වැඩසටහන් පෙළගැස්මක්

- **ස්වයං ඇගයීම**

ස්වයං ඇගයීම උදෑසන හමුවේ ප්‍රධානම අංගයකි. එය දිනකට එක් සේවාලාභියා බැගින් ක්‍රමානුකූලව ඉදිරිපත් කරයි. මෙහිදී සේවාලාභියාට තම ජීවිතයේ ගලා යාම පිළිබඳ නැවත හැරී බැලීමක් සිදු කිරීමට සලස්වයි. ඒ අනුව සේවාලාභියා ඔහුගේ ළමා කාලය, අධ්‍යාපන ජීවිතය, වෘත්තිය ජීවිතය, සමාජ සම්බන්ධතා හා කුටුම්බ ජීවිතය ආදී වන ඔහුගේ ජීවිතයේ විවිධ කලාප පිළිබඳවත් ඒවායේ සාධනීය හා නිශේධනීය ලක්ෂණ පිළිබඳවත් ස්වයං ඇගයීමකට ලක් කරනු ලබයි. මින් ජීවිතයේ බොහෝ බිද වැටීම් සමග මත්ද්‍රව්‍ය භාවිතය බැදී ඇති ආකාරය හදුනා ගැනීමට සේවාලාභියාට අවකාශයක් සැලැසෙන බැවින් එහි ප්‍රතිකාරක්මක අගය ඉහළ වටිනාකමක් උසුලයි. එසේම අනෙකුත් සේවාලාභීන්ට තමා පිළිබද පරාවර්ථනය කිරීමටත් මින් අවස්ථාවක් උදා වේ. එසේම වෙනත් පුද්ගලයෙකුගේ පිවිතය දෙස සමීපව අධ්‍යනය කර මත්ද්‍රව්‍ය භාවිතය සමග ජීවිතය බිද වැටෙන ආකාරය හදුනාගැනීමට අනෙකුත් සේවාලාභීන්ටද මෙයින් අවස්ථාව හිමි වේ.

- **අන් ඇගයීම**

සේවාලාභියෙකුගේ ස්වයං ඇගයීම තුළ දැකගනීමට අපොහොසත් වූ අනෙකුත් ධණාත්මක සහ සෘණාත්මක කරුණු වෙනත් සේවාලාභියෙකු විසින් පෙන්වාදීම අන් ඇගයීමයි. විශේෂයෙන් මෙහිදී මධ්‍යස්ථානය තුළදී අත්පත් කරගත් වර්ධනයන් ඇගයීම කෙරෙහි වැඩි අවධානය යොමු කරයි. සහෝදර සේවාලාභියකු විසින් මෙය ඉදිරිපත් කරන බැවින් ස්වයං ඇගයීම සිදු කරන සේවාලාභියාට එය දැඩි අභිප්‍රේරණයකි.

- **තක්සේරුව**

ස්වයං ඇගයීය හා අන් ඇගයීම ඉදිරිපත් වූ පසු එම කරුණු හරහා ඉදිරිපත් කිරීම් ද්විත්වයට තක්සේරු අගයක් ලබා දීම මෙහිදී සිදු වේ. විශේෂයෙන් අදහසක් දෙස අවධානය යොමු කර එය නිවැරදිව අවබෝධ කර ගැනීමටත් විනිශ්චය කිරීමටත් පුහුණු කිරීම මින් අපේක්ෂා කරයි.

- **නිරීක්ෂණය**

මෙය පෙර සැදෑ හමුවේ සිට උදෑසන හමුව දක්වා වන සියලු සිදුවීම් පෙළගස්වමින් ඉදිරිපත් කරනු ලබන්නකි. මෙමගින් ඉදිරිපත් කරන්නාගේ ස්මරණ හැකියාව සහ කෙතරම් දුරට ප්‍රතිකාර ක්‍රියාවලිය හා දෛනික සිදුවීම් පිළිබඳ සතිමත්ව පවතින්නේ ද යන්නත් අවබෝධ කරගත හැකිය.

- **ප්‍රවෘත්ති ප්‍රකාශය**

දෛනික පුවත් කිහිපයක් තෝරා ගනිමින් එය අංගයක් ලෙස ඉදිරිපත් කිරීම මේ තුළ සිදුවේ. මෙමගින් දේශීය හා විදේශීය සිදුවූ වැදගත් සිදුවීම් සේවාලාභීන්ට දැන ගැනීමට හැකි වන අතර

ඉදිරිපත් කරන සේවාලාභියා එය වඩාත් නිර්මාණශීලී ලෙස ඉදිරිපත් කිරීමට නිරතුරු උත්සහ කරයි. එදිනෙදා ජීවිතයට වැදගත් වන සමාජ සංසිද්ධි පිළිබද සංවේදී බව ඇති කිරීම මෙයින් අපේක්ෂා කරයි.

- **විශේෂ කතාව**

ස්වයං ඇගයීම ලබාදුන් සේවාලාභියා විසින්ම දවසේ විශේෂ කතාව ලබාදීම සිදුකෙරේ.මෙය වඩාත් සිත්ගත් අංගයකි. එය ගද්‍ය - පද්‍ය, සඳැස් - නිසඳැස්, චරිතකතා, උපමා කතා ආදිය භාවිත කරමින් ඉදිරිපත් කරන්නකි. මෙහි ප්‍රතිකාරාත්මක ප්‍රවේශය නම් ඉදිරිපත් කරන කතාංගයේ අන්තර්ගත හරය තුළින් ලබාදෙන පණිවිඩයයි. කතාංගය කෙටි උවද එයින් ලබා දෙන පණිවුඩය වඩාත් වැදගත් කොට සලකයි. එයචින්තනය, අවබෝධය, තර්කනය හා නිර්මාණශීලි බව ආදිය වර්ධනය කරගැනීමට කදිම අවස්ථාවක් වේ.

- **අදහස් හා යෝජනා**

සියලු සේවාලාභීන්හට විවෘත වූ මෙම අංගය තුළින් අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට හැකියාව ලැබේ. එසේ ඉදිරිපත් කරන යෝජනා පෞද්ගලික නොවූ හා ප්‍රතිකාර ක්‍රියාවලිට සම්බන්ධ යෝජනා විය යුතුය. එසේ ඉදිරිපත් කරන ලද යෝජනා හා අදහස් කාර්ය මණ්ඩලය විසින් සාකච්ඡා කොට ශක්‍යතාව මත ඉටුකිරීම සදහා අවශ්‍ය මැදිහත්වීම් සිදු කරනු ලැබේ.

- **දවස ලබා දීම**

මෙය කාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබයි. දවස ලබා දීමේදී දවස සැලසුම් කර ඇති ආකාරය සේවාලාභීන්ට ඉදිරිපත් කරයි. ඒ අනුව සේවාලාභීන්ට දිනය තුළඒ ඒ වැඩසටහන් සඳහා පූර්ව සූදානම්වීමක් සදහා අවශ්‍ය දැනුවත් කිරීමක් ලෙස මෙම අංගය හඳුන්වාදිය හැක.

- **ගුරු නිරීක්ෂණය**

උදැසන හමුවේ සමස්ත අංග පිළිබඳ නැවත මතකය ආවර්ජනය කරමින් ඒ පිළිබඳ උපදේශකවරයා තුළ ඇති අදහස් ද සංක්ෂිප්ත කොට ප්‍රතිකාරාත්මක ප්‍රවේශයකින් ප්‍රතිපෝෂණයක් ලබා දීමමෙහිදී සිදුකරයි.සේවාලාභීන්ගේ ඉදිරිපත් කිරීම් වල පැවැති ධණාත්මක හා සෘණාත්මක ලක්ෂණ ඇගයීමට ලක් කරමින් ඒ තුළින් සේවාලාභීන්ගේ පෞර්ෂය මෙන්ම ආකල්ප සංවර්ධනය කිරීම සඳහාද මැදිහත්වීමට අවකාශයක් විවෘත කර ගැනීම මෙම අංගයෙන් අපේක්ෂා කරයි.

## 10.2. අධ්‍යාපන වැඩසටහන්

- අධ්‍යාපන වැඩසටහන් අවශ්‍ය වන්නේ සේවාලාභීන්ට මත්ද්‍රව්‍යයේ සැබෑ ස්වරූපය, සොබාදහමේ අගය සහ සුන්දරත්වය, මත්ද්‍රව්‍යය උප සංස්කෘතියේ ක්‍රියාකාරිත්වය, ශරීරයේ සහ එහි කෘතත්‍යයන්, ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග ආදී විවිධ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව හා සමාජයේ විවිධ පැතිකඩ යනාදිය ගැන දැනුමත්, අවබෝධයත් ලබා දීමට ය.

## 10.3. පුද්ගල උපදේශනය

උපදේශනය යනු උපකාර කිරිමේ ක්‍රියාවලියකි. මෙහිදී උපකාර කළ යුත්තේ සේවාලාභියාගේ මත්ද්‍රව්‍ය පිළිබඳව තිබෙන වැරදි සංජානනයන් වෙනස් කර ගැනීමට ය. සමාජ සම්බන්ධතා දියුණු කර ගැනීමට සහ ධණාත්මකව උපස්ථම්භන ඇති කර ගැනීමටත්ය.

## 10.4. ක්‍රීඩා සහ විනෝදාත්මක වැඩසටහන්

සේවාලාභියා සෞඛ්‍ය සම්පන්නව සහ ප්‍රබෝධමත්ව පවත්වාගෙන යාම සඳහා ක්‍රීඩා සහ ප්‍රබෝධාත්මක අවස්ථා අවශ්‍යය වේ. තවද ඒවා සාමාන්‍ය ජීවන රටාවකට අන්තර්ග්‍රහනය කිරීම සඳහා උපකාරීවේ.

## 10.5. නිශ්ශබ්ද කාලය

මෙය විශේෂ වැදගත්කමක් උසුලන අංගයකි. මෙහිදී සේවාලාභියා වෙනත් කාර්යන්ගෙන් නිදහස්ව නිහඬව සිටීමට යොමු කරයි. එසේම එම කාලය තුළ තමා පිළිබඳව සිතන්නට පොළඹවනු ලබයි. නිශ්ශබ්ද කාලය තුළින්, පුද්ගලයෙකුට තනිව ගත කරන්නට සිදුවන මොහොතක් අපහසුවකින් තොරව ගත කිරීමට පුහුණු කිරීමත් එවැනි අවස්ථාවක් තමන් ගැන සිත යොමු කිරීමටත්, අනාගතය ගැන සිහින ගොඩනැගීමට සහ සැලසුම් කිරීමටත් ලැබෙන කදිම අවස්ථාවක් ලෙස හඳුනා ගැනීමට සැලැස්වීමත් මෙහි මූලික අරමුණකි.

## 10.6. සේවාලාභීන් සඳහා විශේෂිත ක්‍රියාකාරකම්.

- **සේවාලාභීන් සෞන්දර්යාත්මක රසවින්දනයන් සඳහා යොමු කිරීම.**

සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම විවිධ කලා හැකියාවන් ඇති සේවාලාභීන් සිටින අතර ඔවුන්ගේ හැකියාවන් දියුණු කිරීම මෙන්ම සේවාලාභීන්ගේකලා රස වින්දනය ප්‍රගුණ කිරීමමඟින් මත්ලෝලිත්වයෙන් ඉවත් වීමට පෙළඹවීම් ඇති කිරීම උදෙසා වැඩසටහන් සංවිධානය කළ හැකිය. ප්‍රතිකාර කාර්ය මණ්ඩලයට අමතරව මේ සඳහා සම්පත් දායකයින්ගේ සහය ලබාගත හැකිය. එමෙන්ම කණ්ඩායම් ක්‍රියාකාරකම් වලදී මෙම විෂය ආශ්‍රිත තරඟ පවත්වැත්වීම, සහතික ප්‍රධානය, ත්‍යාගප්‍රධානය ආදිය මඟින් ඔවුන්ගේ ඉදිරිපත් වීමේ හැකියාවන් පිළිබඳ අගය කිරීමක් ලබා දිය හැකි අතර ඔවුන් දිරිමත් කළ හැකි වේ.

- **සාහිත්‍යය රසවින්දනය සඳහා සේවාලාභීන් යොමු කිරීම.**

ප්‍රතිකාර මධ්‍යස්ථාන වල නේවාසික සේවාලාභීන්ගේ සාහිත්‍යය රසවින්දනය ඇති කිරීම උදෙසා රචනා, කෙටිකථා, නිසදැස්, කවි, ගීත රචනා ආදිය පරිශීලනය සඳහා ඔවුන් පොළඹවන කරන අතර ඒ සඳහා වරින්වර තරඟද පැවැත්වියහැකි වේ.

- **බාහිර පරිසරය ආශ්‍රිත ක්‍රියාකරකම්.**

අදාළ ප්‍රතිකාර කාලය තුළ සේවාලාභියාගේ විවිධ රුචිකත්වයන් ඇති කිරීමේ අරමුණින් සේවාලාභීන් බාහිර ක්‍රියාකාරකම් සඳහා යෙදවිය හැක.මේසඳහා තෝරාගන්නා ලද දර්ශනීය ස්ථාන, සිද්ධස්ථාන, අධ්‍යාපනික වටිනාකමින්යුත් ස්ථාන සඳහා සේවාලාභින් රැගෙනයාමේ හැකියාව පවතී.මෙහිදී ඔවුන්ගේ වගකීම පැවරෙන කාර්ය මණ්ඩලය සේවාලාභීන්ගේ ආරක්ශාව තහවුරු කිරීමට කටයුතු කළ යුතු ය. අවදානම්සහිත ස්ථාන මේ සඳහා භාවිතා නොකිරීමට වගබලා ගත යුතු ය. මත්ලෝලිත්වයෙන්තොරව පරිසරය රසවිදීම, කණ්ඩායම් හැඟීම් දියුණු කිරීම. ඒකාකාරීත්වයෙන් නිදහස් කිරීම, අධ්‍යාපනික දැනුම ලබාදීම, අධ්‍යාත්මික සුවය වර්ධනය කිරීම ආදිය මෙම වැඩසටහන් මඟින් බලාපොරොත්තුවේ.

- **ආගමික වැඩසටහන.**

සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම ඒඒ ආගම් අදහන සේවාලාභීන් උදෙසා අදාළ පහසුකම් ලබාදිය යුතුය. බෞද්ධ සේවාලාභින් සෑම පුර පසළොස්වක පොහෝ දිනකම සිල් සමාදන් වීම සඳහා යොමු කළ හැකිය. එමෙන්ම ඔවුන් ධර්ම දේශනා ශ්‍රවන සඳහාද යොමු කළ හැකි වේ. එසේම ක්‍රිස්තියානි, කතෝලික, ඉස්ලාම්, හින්දු සහ වෙනත් ආගමිකයින් සඳහා ද තමන්ගේ ආගම් ඇදහීමට අවස්ථා ලබාදිය යුතුය. රාමසාන්, තෛපොන්ගල්, නත්තල්, වෙසක්, පොසොන් වැනි විශේෂිත

ආගමික දිනයන්හි සේවලාභීන් විවිධ ආගමික ක්‍රියාකාරකම් වල යෙදවිය යුතුවේ. මේ මඟින් සේවාලාභීන්ගේ ආකල්ප, සංස්කෘතික අගයන්ගේ මෙන්ම අධ්‍යාත්මික ගුණයන්ගේ සංවර්ධනයක් බලාපෙරොත්තු වෙයි.

- **ක්‍රීඩා වැඩසටහන**

සෑම මධ්‍යස්ථානයකම සේවාලාභීන් ඔවුන්ගේ ශාරීරික යෝග්‍යවතාවය සළකා බලා ක්‍රීඩා කටයුතු වල නියැලීමට අවශ්‍ය පහසුකම් සැලසිය යුතුවේ. මෙහිදී වොලිබොල්, ක්‍රිකට්, බැඩ්මින්ටන් සහ වෙනත් සුදුසු ක්‍රීඩා සඳහා ඔවුන් යෙදවිය යුතුවේ. එමෙන්ම ගෘහස්ත ක්‍රීඩා පහසුකම් සපයා දිය යුතු අතර ඒ සඳහා යොමුවීමට පෙළඹවීම ඇතිකළ යුතුවේ. මධ්‍යස්ථාන තුල, මධ්‍යස්ථාන අතර මෙන්ම බාහිර ප්‍රජා කණ්ඩායම් සමඟ විවිධ ක්‍රීඩා තරග සඳහා සේවාලාභීන් යොමුකරවීමට කටයුතු කළ හැකිය. සේවාලාභීන් ක්‍රීඩාවට යොමු කිරීම, මෙහෙය වීම, අධීක්ෂණය කිරීම හා අභිප්‍රේරණය ඇති කිරීම, කාර්යමණ්ඩලය විසින් සිදු කළයුතු ය. ක්‍රීඩා කිරීමේදි සේවාලාභීන්ගේ ආරක්ෂාව පිළිබඳව අවදානය යොමු කිරීමද වැදගත් වේ.

- **කායික වර්ධනය**

වෛද්‍ය නිර්දේශ මත හෙද නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ සේවාලාභීන්ගේ ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කොට ඒ අනුව සෑම මධ්‍යස්ථානයකම ඒ ඒ සේවාලාභියා සඳහා කායික වර්ධනය වෙනුවෙන් නියමිත අභ්‍යාස වල යෙදවිය යුතුය.

- **කෘෂිකාර්මික වැඩසටහන**

සේවාලාභින් කෘෂිකාර්මික කටයුතු වල නියැලීමට පෙළඹවිම තුලින් ඔවුන් ගේ කෘෂිකාර්මික දැනුම, අවබෝධය, පරිසරයට ඇලුම් කිරීම, කණ්ඩායම් හැඟීම වර්ධනය, ක්‍රියාශීලී බව ආදිය සංවර්ධනය කිරීම බලාපොරොත්තු වන අතර මේ සඳහා සේවාලාභීන් පෙළඹවිය යුතු ය. අදාළ පහසුකම් ද ලබා දිය යුතු වේ.

- **වෘත්තීය පුහුණු වැඩසටහන**

සෑම මධ්‍යස්ථානයකම සේවාලාභීන් සඳහා ප්‍රතිකාරාත්මක සේවාවන් වශයෙන් විවිධ වෘත්තිය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. ලියුම් කවර සැකසිම, මල්පෝච්චි සැකසීම, මල්වගාව, පොල්කටු ආශ්‍රිත නිර්මාණ, ඉටිපන්දම් නිෂ්පාදනය, සබන් නිෂ්පාදනය, ඉදල් නිෂ්පාදනය, මැහුම් ශිල්පය, පාපිසි සැකසීම වැනි ක්‍රියාකාරකම් මේ සඳහා භාවිතා කළ හැක. සේවාලාභීන් තුළ වෘත්තිය දැනුම

අවබෝධය සහ මත්ද්‍රව්‍ය ආශ්‍රිත බැඳීම් අවම කිරීම යනාදිය මින් බලාපොරොත්තු වේ. එමෙන්ම තරුණ සේවාලාභීන් නේවාසික කාලයෙන් පසු දිගු කලීන වෘත්තීය පාඨමාලා සඳහා ජාතික ආධුනිකත්ව මණ්ඩලය, වෘත්තීය පුහුණු අධිකාරිය වැනි ආයතන වලට අනුයුක්ත කෙරේ.

## 10.7. ප්‍රතිකාර මධ්‍යස්ථානයක දෛනික කාල සටහනක් සඳහා නිදර්ශකයක්

මෙය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථානයන් තුළ මේ වන විට ක්‍රියාත්මක දෛනික කාල සටහන් අකෘතිය වේ. අනෙකුත් ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළ දෛනික කාල සටහන් සඳහා දළ අකෘතියක් ලෙස මෙය යොදා ගත හැකි ය. නමුත් දෛනික කාල සටහන් අකෘති තුළ ආයතනයේ ප්‍රතිකාර ක්‍රමවේදය අනුව වෙනස්කම් පැවතිය හැක.

| **වේලාව** | **වැඩසටහන** |
|---|---|
| පෙ.ව.05.30 | අවදිවීම |
| පෙ.ව.05.30 - පෙ.ව.06.00 | පුද්ගල සනීපාරක්ෂක කටයුතු |
| පෙ.ව.06.00 - පෙ.ව.06.15 | ආගමික වතාවත් ඉටු කිරීම |
| පෙ.ව.06.15 - පෙ.ව.06.30 | උදෑසන තේ පානය |
| පෙ.ව.06.30 - පෙ.ව.07.00 | ශාරීරික ව්‍යායාම සහ යෝග අභ්‍යාස |
| පෙ.ව.07.00 - පෙ.ව.08.30 | ආයතනය පිරිසිදු කිරීම |
| පෙ.ව.08.30 - පෙ.ව.09.00 | උදෑසන ආහාරය |
| පෙ.ව.09.00 - පෙ.ව.09.15 | කෙටි විවේකය |
| පෙ.ව.06.15 - පෙ.ව.09.45 | උදා හමුව |
| පෙ.ව.09.45 - පෙ.ව.10.00 | තේ පානය |
| පෙ.ව.10.00 - පෙ.ව.11.15 | පුද්ගල උපදේශනය, කණ්ඩායම් උපදේශනය |
| පෙ.ව.11.15 -ප.ව.12.30 | අධ්‍යාපන වැඩසටහන |
| ප.ව.12.30 - ප.ව.01.00 | දිවා ආහාරය |
| ප.ව.01.00 - ප.ව.02.00 | විවේක කාලය |
| ප.ව.02.00 - ප.ව.03.00 | විනෝදාත්මක වැඩසටහන් |
| ප.ව.03.00 -ප.ව.03.15 | සවස තේ පානය |
| ප.ව.03.15 - ප.ව.05.15 | ගෘහස්ථ සහ එළිමහන් ක්‍රීඩා |
| ප.ව.05.15 - ප.ව.06.15 | පුද්ගල සනීපාරක්ෂක කටයුතු |
| ප.ව.06.15 - ප.ව.06.30 | ආගමික වතාවත් ඉටු කිරීම |
| ප.ව.06.30 - ප.ව.07.00 | සංයම අභ්‍යාස |
| ප.ව.07.00 - ප.ව.08.00 | සැඳෑ හමුව |

| | |
|---|---|
| ප.ව.08.00 - ප.ව.08.30 | රාත්‍රී ආහාරය |
| ප.ව.08.30 - ප.ව.09.45 | ගෘහස්ත ක්‍රීඩා සහ දිනපොත් සටහන් තැබීම |
| ප.ව.09.45 - ප.ව.10.00 | විවේකය |
| ප.ව.10.00 | නින්දට යාම |

සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම දෛනික කාලසටහනක් ක්‍රියාත්මක කළ යුතු අතර සුවිශේෂි අවස්ථාවලදී සේවාලාභීන්ගේ සුබසිද්ධිය වෙනුවෙන් සහ විවිධත්වය සඳහා වෙනත් අංගද කාල සටහනට එකතු කිරීමේ හැකියාව පවතී. ඒ අනුව පවුල් උපදේශනය, දෙමාපිය හමුව, පසුරැකවරණ හමුව, සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්, ශ්‍රමදාන වැඩසටහන් , කෘෂි වගා කටයුතු, සේවාලාභීන්ගේ මෘදු කුසලතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන්, ආගමික හා අධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීම සඳහා වැඩසටහන් ආදිය මධ්‍යස්ථාන තුළ සංවිධානය කරනු ලබයි.

# 11. අධිකරණ නියෝග මත සේවාලාභීන් ප්‍රතිකාරයට යොමු කිරීම.

## 11.1. හැඳින්වීම

අධිකරණ නියෝග මත ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත ඇතුළත් කිරීමේදී විධිමත් මාර්ගෝපදේශ අනුගමනය කිරීම ඉතාමත්ම වැදගත් වේ. එමගින් සේවාලාභියාගේ ප්‍රතිකාර කටයුතු විධිමත් වන අතරම සේවාලාභියාගේ සහ ප්‍රතිකාර කාර්ය මණ්ඩලයේ රැකවරණයට සහ සුබසාදනයට මහගු මෙහෙයක් ඉටු වේ. මෙම පරිච්ඡේදය තුලින් බලාපොරොත්තු වන්නේ එම මාර්ගෝපදේශ පිළිබඳව මූලික අවබෝධයක් ලබා දීමයි. මෙම අංශය තුළදී අධිකරණ නියෝග මත සේවාලාභීන් ප්‍රතිකාර සඳහා ඇතුළත් කළ හැකි ප්‍රතිකාර මධ්‍යස්ථාන මොනවාද පිළිබඳව මූලක අවබෝධයක් තිබීම ඉතාම වැදගත් වේ. එහිදී මූලික ලෙසම 2007 අංක 54 ඖෂධ සඳහා ඇබ්බැහි වූ තැනැත්තන්ගේ ප්‍රතිකාර හා පුනරුත්ථාපන පනත සහ එම පනතට අදාළව 2010 අංක 1653/19 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන ද ඇතුළත්ව පවතින නීති රීති වලට අනුව මෙම සේවාලාභීන් ප්‍රතිකාර සඳහා යොමු කළ යුතුවේ. එසේම අණ පනත් අලුතින් නිර්මාණය වන විටදී එම නව නීති රෙගුලාසි සමග මෙම මාර්ගෝපදේශ යාවත්කාලීන වීම සිදු වන අතර අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් එය සිදු කරනු ලැබේ.

වර්ථමානයේ පවතින නීති රාමුවලට අදාළව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රමිතීන්ට අනුව පහත සඳහන් ස්ථාන තුළ අධිකරණය මගින් යොමු කරනු ලබන සේවාලාභීන් පුනරුත්ථාපනය කිරීමට හැකියාව ලැබේ.

- අන්තරාකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් පවත්වාගෙන යනු ලබන ප්‍රතිකාර මධ්‍යස්ථාන හතරකි.

  සැ.යු.- එසේ යොමු කරන සේවාලාභීන් වයස අවුරුදු 50ට අඩු විය යුතුය.

1. මධ්‍යම පළාත් නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය (මෙත් සෙවණ)
   සැ.යු.- (වයස අවුරුදු 21ට අඩු තරුණයින් සඳහා)
2. නවදිගන්තය නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය
3. බස්නාහිර පළාත් නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය (සෙත් සෙවණ)
   සැ.යු.- (විශේෂයෙන් මෙහි පිරිමි රැඳවියන්ට අමතරව කාන්තා රැඳවියන්ගේ ද ප්‍රතිකාර කටයුතු සිදු කරනු ලැබේ.)
4. දකුණු පළාත් නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය (මිත්සෙවණ)

මෙම මධ්‍යස්ථාන හතර ස්වේඡාවෙන් ප්‍රතිකාර සඳහා යොමුවන මත්ද්‍රව්‍ය භාවිත පුද්ගලයින් සඳහා මූලිකත්වය ලබා දෙන අතර අධිකරණය මගින් යොමු කළහොත් එසේ යොමු කරනු ලබන සීමා සහිත සේවාලාභීන් පිරිසකට පමණක් ප්‍රතිකාර සිදු කරනු ලැබේ.

2010 අංක 1653 / 19 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත සහ අන්තරාකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යටතේ නියාමනය සහ අධීක්ෂණය සිදුවන පහත සඳහන් නම් කරන ලද බන්ධනාගාර දහය හරහා ද අධිකරණය මගින් යොමු කරන සේවාලාභීන්ගේ ප්‍රතිකාර කටයුතු පවත්වාගෙන යනු ලබයි.

- පල්ලෙකැලේ
- පල්ලංසේන
- මීතිරිගල
- කන්දෙවත්ත

- අඹේපුස්ස
- තල්දෙන
- වටරැක
- අනුරාධපුර

- කළුතර
- වීරවිල

මෙම ප්‍රතිකාර මධ්‍යස්ථාන බන්ධනාගාර නීති-රීති පද්ධතිය සහ ආචාර ධර්ම පද්ධතිය තුළ සිටිමින් ප්‍රතිකාර කටයුතු ක්‍රියාත්මක වන අතර ප්‍රතිකාර කටයුතු  අන්තරාකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙතින් නියාමනය සහ අධීක්ෂණය කරනු ලැබේ.

ඒ අනුව අවශ්‍ය විටෙක එම බන්ධනාගාර වෙත ද අධිකරණය නියමයන් මත සේවාලාභීන් ඇතුළත් කිරීමේ හැකියාව පවතී. මෙම බන්ධනාගාර දහයට අමතරව පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය මගින් ද පහත සඳහන් පරිදි ප්‍රතිකාර මධ්‍යස්ථාන තුනක් පවත්වාගෙන යනු ලබයි.

1. කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය
2. සේනපුර ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය
3. වවුනියා ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය

මෙම මධ්‍යස්ථාන තුළ පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල් කාර්යාංශය මගින් නිර්දේශිත ප්‍රතිකාර ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන අතර එම මධ්‍යස්ථානයන් ද අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ඍජු නියාමනයට සහ අධීක්ෂණයට යටත් වේ. අවශ්‍ය අවස්ථා වලදී මෙම මධ්‍යස්ථාන වෙතද සේවාලාභීන් යොමු කිරීමට ඉල්ලුම් කිරීමේ හැකියාව ඇත. මෙයට අමතරව සමාජ සේවා දෙපාර්තුමේන්තුව යටතේ ක්‍රියාත්මක පුවක්පිටිය ජයවිරු සමාධි ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථානය වෙතටද අධිකරණය මගින් යොමු කරනු ලබන සේවාලාභීන් ඇතුළත් කළ හැකි අතර සමාජ සේවා දෙපාර්තුමේන්තුව යටතේම ක්‍රියාත්මක ඌව පළාත් බදුල්ල උඩුවර ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයටද අධිකරණය මගින් යොමු කරන සේවාලාභීන් ඇතුළත් කිරීමේ හැකියාව පවතී. (බදුල්ල උඩුවර මධ්‍යස්ථානයට ඇතුළත් කළ හැක්කේ ඌව පළාතේ සේවාලාභීන් පමණි.) මෙම ඉහත සඳහන් සියලුම මධ්‍යස්ථාන තුළ සම්මත කරනු ලැබූ නමුත්, එකිනෙකට වෙනස් ප්‍රතිකාර වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර එම ප්‍රතිකාර ක්‍රමවේදයන් සහ මධ්‍යස්ථාන තුළ පවත්වාගෙන යනු ලබන සම්මත ප්‍රමිතීන් අන්තරායක ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් නිරන්තරයෙන් නියාමනය සහ අධීක්ෂණය කරනු ලැබේ.

## 11.2. අධිකරණය මගින් සේවාලාභීන් ප්‍රතිකාර සඳහා ඇතුළත් කර ගැනීමේදී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ.

විශේෂයෙන්ම මෙම අංශය සඳහා සුවිශේෂී වූ මාර්ගෝපදේශයන් හඳුන්වාදීමේ මූලික අරමුණ වන්නේ එම මාර්ගෝපදේශ මඟින් ප්‍රතිකාර ක්‍රමවේදය සාර්ථක කරකර ගැනීම සඳහා මෙන්ම සේවාලාභීන්ගේ සහ ප්‍රතිකාර කාර්ය මණ්ඩලයේ ආරක්ෂණය සහ සුබසාධනය සඳහා සුවිශේෂී කාර්යක් ඉටුවන බැවිණි. කෙසේ නමුත් මෙම මාර්ගෝපදේශ අනුගමනය කිරීමේදී සම්මත නීති

රීතීන්ට සහ විධිමත්ව ස්ථාපිත වී ඇති ප්‍රතිකාර වැඩසටහනට සහ ප්‍රතිකාර වැඩසටහනේ මූලික ව්‍යුහයට ගැළපෙන ලෙස භාවිතා කිරීමට හැකියාව පවතී.

මෙහිදී අධිකරණය මගින් යොමු කරන සේවාලාභීන්ට අදාළ මාර්ගෝපදේශයන් පහත සඳහන් ශීර්ශ යටතේ ඉදිරිපත් කිරීයි.

1. ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුලත් කර ගැනීම.
2. ප්‍රතිකාර වැඩසටහන තුළ රඳවා තබා ගැනීම.
3. ප්‍රතිකාර මධ්‍යස්ථානයෙන් බැහැර කිරීම.

## 11.3. අධිකරණය මගින් යොමු කළ සේවාලාභියෙකු ප්‍රතිකාරය සඳහා ඇතුළත් කර ගැනීමට අදාළ මාර්ගෝපදේශ.

- අධිකරණය මගින් ලබාදෙන දිනයේදීම සේවාලාභියා ප්‍රතිකාරය සඳහා ඇතුළත් කර ගැනීම සිදුකළ යුතුය. නමුත්,
  - මධ්‍යස්ථානයේ උපරිම ධාරිතාවය සම්පූර්ණ වී තිබීම.
  - බෝවන රෝග හෝ ගැටුම් සහ හඳුනාගන්නා ලද සුවිශේෂී ගැටලුකාරී තත්ත්වයන් පැවතීම

වැනි සුවිශේෂී හේතු පවතී නම්, අධිකරණයට හෝ බන්ධනාගාරයට ලිඛිත පණිවිඩ ලබාදී අවශ්‍ය කාලය ලබා ගැනීමට කටයුතු කළ හැක.

- අධිකරණය හරහා යොමු කළ සේවාලාභියෙකු බන්ධනාගාරය හරහා පැමිණි විට ලේඛන නිවැරදිව පරීක්ෂා කර බලා බන්ධනාගාර නිලධාරින් රැඳී සිටියදීම ශාරීරික පරීක්‍ෂාව සිදුකර ගැටලුකාරී තත්ත්වයන් හඳුනාගත යුතුය.
  සැ.යු.- ශරීරයේ පහරදීම්, තැලීම්, සහ පිලිස්සීම් සළකුණු පවතී නම් ඒ සම්බන්ධව සේවාලාභියාගේ ප්‍රකාශයන් ද සළකා බලා ඇතුළත් කර ගැනීම තීරණය කළ යුතු ය.

- ප්‍රතිකාර මධ්‍යස්ථානයේ පවත්වාගෙන යනු ලබන නිර්දේශිත ප්‍රතිකාර කාලයට සහ ප්‍රතිකාර වැඩසටහනට අනුකූල වන පරිදි සේවාලාභීන් ඇතුළත් කර ගැනීම.
  - යම් අවස්ථාවලදී ප්‍රතිකාර කාලය සමඟ දඬුවම් කාලයක් ද ඇතුළත් කර මධ්‍යස්ථාන වලට සේවාලාභීන් යොමු කරන විට දඬුවම් කාලය බන්ධනාගාරයේ ගත කර දඬුවම් කාලය අවසානයේ ප්‍රතිකාර කාලයට පමණක් ප්‍රතිකාර මධ්‍යස්ථානයට ඇතුළත් කර ගැනීම ප්‍රතිකාර කටයුතු සඳහා වඩාත් සුදුසු බැවින් ඒ සම්බන්ධව අධිකරණය දැනුවත් කර අදාළ ඉල්ලීම් ඉදිරිපත් කිරීමට මධ්‍යස්ථානයට හැකියාව පවතී.
  - එසේ සිදු කිරීමට අධිකරණය කටයුතු නොකරන්නේ නම් එම සේවාලාභීන් නම් කරන ලද බන්ධනාගාර වෙත හෝ දැනට ක්‍රියාත්මක දීර්ඝ කාලීන ප්‍රතිකාර කටයුතු සිදුකරන මධ්‍යස්ථානවලට යොමු කරන ලෙස අදාළ ඉල්ලීම් සිදු කිරීමට ප්‍රතිකාර මධ්‍යස්ථානවලට හැකියාව ඇත.
  - අධිකරණය මගින් යොමු කරන සේවාලාභියා ප්‍රතිකාරය සඳහා ඇතුළත් කරන අවස්ථාව වන විට කිසියම් අසාධ්‍ය රෝගී තත්ත්වයකින් හෝ බෝවන රෝගී තත්ත්වයකින් පෙළෙන්නේ නම් රෝහල මගින් ප්‍රතිකාර ලබාදී මධ්‍යස්ථානයේ ප්‍රතිකාරයට සුදුසු මට්ටමකට පත් වූ පසු වෛද්‍ය නිර්දේශ මත මධ්‍යස්ථාන වෙත යොමු කරන ලෙස ඉල්ලීම් සිදුකළ හැකිය.

    ( සැ.යු.- ප්‍රතිකාර මධ්‍යස්ථාන උපදේශකවරයාගේ නිර්දේශ මත මධ්‍යස්ථානයේ ප්‍රධානියා එම ඉල්ලීම සිදුකළ යුතුය)

- කිසියම් මානසික රෝගී තත්ත්වයක් සහිත සේවාලාභියෙකු මධ්‍යස්ථානය වෙත යොමුකර ඇති විටෙකදී මධ්‍යස්ථානය කටයුතු සිදුකරන ආකාරය.
  1. අධිකරණ මනෝ වෛද්‍යවරුන්ගේ හෝ වෙනත් මනෝ වෛද්‍ය නිර්දේශයකින් තොරව යොමුකර ඇත්නම් සහ එම සේවාලාභියා සමඟ කටයුතු කරගෙන යාම ගැටලුකාරී තත්ත්වයක ඇතැයි උපදේශකවරයා නිර්දේශ කරන්නේ නම් එම සේවාලාභියා ඉහත වෛද්‍යවරු වෙත යොමු කර අධිකරණය මගින් වාර්තා

ලබාගෙන ප්‍රතිකාරයට ඇතුළත් කර ගන්නේද නැද්ද යන්න තීරණය කිරීමට ප්‍රතිකාර මධ්‍යස්ථානයට හැකියාව ඇත.

2. වෛද්‍ය වාර්තාව සහිත ව පැමිණෙන මානසික රෝග සහිත සේවාලාභීන් ප්‍රතිකාර වැඩසටහනට හානි කර නොවන්නේද යන්න තීරණය කිරීමෙන් අනතුරුව ඇතුළත් කර ගැනීමට මධ්‍යස්ථානය කටයුතු කළ යුතු අතර පාලනය කරගත නොහැකි උග්‍ර මානසික රෝගී තත්ත්වයන් සහිත සේවාලාභියෙකු නම් සුදුසු රෝහලකට හෝ ඒ සඳහා පහසුකම් සහිත මධ්‍යස්ථානයකට යොමු කරන ලෙස ඉල්ලීම් කිරීමට ප්‍රතිකාර මධ්‍යස්ථානයට හැකියාව ඇත.

## 11.4. අධිකරණය මගින් යොමු කළ සේවාලාභියෙකු ප්‍රතිකාර වැඩසටහන තුළ රඳවා තබා ගැනීමට අදාළ මාර්ගෝපදේශ

- මධ්‍යස්ථානය තුළ පවත්වාගෙන යනු ලබන නිර්දේශිත සහ අනුමත ප්‍රතිකාර ක්‍රමවේදයට අනුකූල වන පරිදි මෙම සේවාලාභියාගේ ප්‍රතිකාර කටයුතු සිදුවිය යුතු අතර අධිකරණය මගින් යොමුවීම මත කිසිදු අසාධාරණයක් හෝ විශේෂීකරණයක් සිදු නොවිය යුතුය.
- අධිකරණය මගින් සේවාලාභියෙකු ප්‍රතිකාර මධ්‍යස්ථානයට යොමු කළ විට හැකි ඉක්මණින් එම තොරතුරු ආයතන ප්‍රධානීන් වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු අතර ප්‍රතිකාර කාලයට අදාළ වාර්තා (විශේෂයෙන් මාසික වාර්තා) අධිකරණය ඉල්ලා සිටින්නේ නම් ඒවා නියමිත දිනට යොමු කිරීමට මධ්‍යස්ථානය කටයුතු කළ යුතුය.
- ප්‍රතිකාර වැඩසටහන අතරතුරදී සේවාලාභියා හදිසි අනතුරකට මුහුණ දීම, රෝගී වීම යන කාරණා තුළදී අවශ්‍යතාවය පරිදි වෛද්‍ය නිර්දේශ මත, උපදේශක නිර්දේශ මත රෝහල් ගත කිරීමට හැකියාව පවතින අතර හැකි ඉක්මනින් ඒ බව සේවාලාභියා යොමු කළ බන්ධනාගාරය හා අදාළ අධිකරණය වෙත දුරකථන පණිවිඩ මගින් සහ ලිඛිතව දැනුවත් කළ යුතුය. භාරකරුවන්ද මේ සමගම දැනුවත් කළ යුතු වේ.

- අධිකරණය මගින් යොමුකළ සේවාභියෙකු ප්‍රතිකාර මධ්‍යස්ථානයෙන් පලායාම සිදුවූ විට වහාම පොලිසියට ඒ බව පැමිණිලි කළ යුතුය. එසේම එම පැන යාමට අදාළ වාර්තාවන් උසාවියට යොමු කළ යුතු අතර බන්ධනාගාරයට ඒ බව පණිවිඩ හරහා දැනුවත් කළ යුතුය. භාරකරුවන්ද මේ සමගම දැනුවත් කළ යුතු වේ.
- අධිකරණ නියෝග මත පැමිණි සේවාලාභියෙකු පාලනය කළ නොහැකි මට්ටමේ ආවේගශීලී හැසිරීම්, ආක්‍රමණශීලී සහ නොසන්සුන් හැසිරීම් පෙන්නුම් කරයි නම්, අනෙකුත් සේවාලාභීන්ගේ සහ නිලධාරීන්ගේ ආරක්ෂාව පිණිස ආසන්නතම පොලිසියට දැනුම් දීමේ හැකියාව එම අවස්ථාවේ රාජකාරියේ නිරත නිළධාරීන්ට හැකියාව පවතී. එසේම 2007 අංක 54 තුළ ඇති වගන්ති අනුව ක්‍රියාත්මක වීමට එම අවස්ථාවේ රාජකාරියේ නිරත නිළධාරීන්ට හැකියාව පවතී.
- අධිකරණය මගින් යොමු කළ සේවාලාභියෙකුගේ මානසික රෝගී තත්ත්වයන් පාලනය කළ නොහැකි මට්ටමක පවතී නම්, එම සේවාලාභීන් රෝහල් ගත කිරීමට මධ්‍යස්ථානයට  හැකියාව පවතින අතර එය සිදුකිරීමට පෙර බන්ධනාගාරය උසාවිය සහ භාරකරුවන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

## 11.5. අධිකරණය මගින් යොමු කළ සේවාලාභියකු ප්‍රතිකාරයෙන් බැහැර කිරීමට අදාළ මාර්ගෝපදේශ.

- රෝහල්ගත කිරීම් සහ අනවසර බැහැරවීම් වලට අදාළ මාර්ගෝපදේශ 12 පරිච්ඡේදය තුළ දක්වා ඇත.
- අධිකරණය මගින් යොමු කළ සේවාලාභියෙකුගේ මරණයකදී  රටේ සාමාන්‍ය නීතිය අනුව කටයුතු කළ යුතුවේ.
- යම් සේවාලාභියෙකු ගෙල සිරවී එල්ලා සිටින අවස්ථාවේදී ඉතා ඉක්මනිනි  නොපැකිළිව ඔහු එම අනතුරින් බේරා ගැනීමටත් ඔහුට අදාල ප්‍රථමාධාර ලබා දීමටත් සේවාලාභියා රෝහල්ගත කිරීමටත් කටයුතු කළ යුතු ය.

- අධිකරණය මගින් යොමු කරනු ලබන සේවාලාභියෙකුගේ භාරකරු අදාළ නියෝගය ලබාදෙන මහේස්ත්‍රාත්වරයා බැවින් ප්‍රතිකාරයෙන් බැහැර කිරීමේ දී ලබා දී ඇති නියෝග පිළිපැදීමට ප්‍රතිකාර මධ්‍යස්ථානය කටයුතු කළ යුතුය. නමුත් අධිකරණය වෙත පහත පරිදි ඉල්ලීම් ඉදිරිපත් කිරීමට හැකියාව පවතී.

  - අධිකරණය මගින් යොමු කළ අයෙකු ප්‍රතිකාර කාලය අවසානයේ නැවත අධිකරණයට යොමු කරන ලෙස නියෝග දී ඇති විටකදී ප්‍රතිකාරයේ ප්‍රගතිය සලකා බලා සාමාන්‍ය පරිදි භාරකරුවන් වෙත භාරදීම සිදු කළ හැක. (මෝසමක් හෝ රෙජිස්ටාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මගින් මේ සඳහා කටයුතු කළ යුතු ය.) මෝසම ඉදිරිපත් කිරීම අදාල භාරකරුවන් විසින් සිදු කළ යුතුය)
  - භාරකරුවන් වෙත භාරදීම සඳහා අධිකරණය මගින් නියෝග ලබාදී ඇති නමුත් සුදුසු භාරකරුවන් නොමැති නම් හෝ හඳුනාගත නොහැකිනම් ප්‍රතිකාර කාලය සම්පූර්ණ වීමට පෙර අධිකරණය දැනුවත් කර විසඳුම් ලබා ගැනීමට කටයුතු කිරීමට ප්‍රතිකාර මධ්‍යස්ථානයට අයිතිය ඇත. ( අවුරුදු 18ට අඩු ළමුන් සඳහා විශේෂ වේ )

## 11.6. විශේෂ බැහැර වීම්

- සේවාලාභියාගේ මව පියා බිරිඳ දරුවන් යන අයගේ මරණයකදී අදාළ සේවාලාභියා සහභාගී කල යුතු වන්නේ නම් එය අධිකරණයේ අවසරය පරිදි බන්ධනාගාර ආරක්ෂාව මත සිදුවිය යුතුය. මෙම කටයුතු සංවිධානය කරදීමේ කාර්ය ප්‍රතිකාර මධ්‍යස්ථාන මගින් සිදුවිය යුතු ය.

සැ.යු.- තව දුරටත් අධිකරණය මගින් යොමු වන සේවාලාභීන් සඳහා වැදගත් වන මාර්ගෝපදේශ 12 වන පරිච්ඡේදය තුළද අන්තර්ගතව ඇත.

# 12. ඇගයීම, අනාගත සැළසුම් සකස් කිරීම හා බැහැර කිරීම.

අන්තරායකර ඖෂධ අවභාවිත කිරීම සඳහා ඇබ්බැහි වූ, සිය කැමැත්තෙන් හෝ අධිකරණමය නියමයක් මගින් හෝ පුනරුත්ථාපන ප්‍රතිකාර මධ්‍යස්ථානයක් තුළ ප්‍රතිකාර ක්‍රියාවලිය සඳහා ඇතුළත් කරගෙන ඇති තැනැත්තකු පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙන් බැහැර කිරීම සඳහා සූදානම් කිරීමේ සමස්ත ක්‍රියාවලිය මෙන්ම  බැහැර කිරීමකදී හෝ බැහැර වීමකදී අනුගමනය කළ යුතු සමස්ත ක්‍රමවේදයන් මෙම පරිච්ඡේදය තුළ ඇතුළත් වෙයි.

## 12.1. සේවාලාභියෙකු ඇගයීම

- නේවාසික මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන සේවාලාභියෙකුගේ ප්‍රගතිය තක්සේරු කිරීම මගින් ඇගයීමට ලක් කළ යුතුය.
- ඇගයීම මගින් ප්‍රධාන ලෙස අරමුණු කරන්නේ සේවාලාභියෙකු ආයතනයෙන් බැහැර කිරීමට සූදානම් කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම ලබා ගැනීමයි. එසේම ප්‍රතිකාර ක්‍රියාවලියේ අතරමැදි කාර්යයන් සඳහාද ඇගයීම් ප්‍රතිඵල භාවිතා කරයි.
- නේවාසික මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන සේවාලාභියෙකුගේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා මනෝවිද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක මානයන් දෙකටම අදාල විවිධ සාධක පරීක්ෂා කිරීම ඇතුළත් විය යුතුය. මෙම අංශ ඇගයීමෙන් සේවාලාභියෙකු විශයෙහි සිදු කරනු ලබන ප්‍රතිකාර වැඩසටහන මගින් සිදු වන මැදිහත්වීම් වල සඵලතාවය මැන බැලීමට, සේවාලාභියාගේ චලනයන් හඳුනාගැනීමට මෙන්ම මත්ද්‍රව්‍ය භාවිතා කරන්නෙකු පසු කරන මතින් නිදහස්වීමේ අදියරයන් වන පූර්වප්‍රවාණුමිතිය, ප්‍රවාණුමිතිය, සූදානම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම, නිදහස්වීම හෝ නැවත භාවිතය යන අදියරයන් හි කුමන අදියරක සේවාලාභියා පසුවන්නේද යන්න  අණාවරණය කර ගැනීමට ද අපේක්ෂා කරයි. එසේම ප්‍රකෘතිමත් වීමට බලපාන පුලුල් සමාජ සන්දර්භය ආශ්‍රිත අභියෝග තේරුම් ගැනීම ඇතුලු පසුවිපරම් ක්‍රියාවලියේදි සැලකිලිමත් විය යුතු සාධක හඳුනාගැනීම මෙන්ම අනාගත සැලසුම්

සකස් කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම් ලබා ගැනීමද ඇගයීම් ක්‍රියාවලිය මගින් අපේක්ෂා කරයි. එපමණක් නොව පුනරුත්තාපන ආයතනයක සමස්ථ ප්‍රතිකාර වැඩසටනහි ශක්තීන් හා දුර්වලතා හඳුනා ගැනිම සහ අඛණ්ඩව සිදු කළ යුතු වැඩිදියුණු කිරිම් හඳුනා ගැනීමටද ඇගයීම් ක්‍රියාවලිය තුලින් මගපෙන්වීම් ලබා ගැනීමේ හැකියාව පවතී.

- සේවාලාභියකු ආයතන ගත වූ පසු අවස්ථා දෙකකදී ප්‍රගතිය තක්සේරු කිරීමහරහා සේවාලාභියෙකු ඇගයීම සිදු කළ යුතුය.

## 12.1. (අ) පළමු ඇගයීම

ප්‍රතිකාර කාලයෙන් අඩක් සම්පූර්ණ වූ පසු සිදුකරනු ලබන සම්භවන ඇගයීමකි. මෙය මත්ද්‍රව්‍ය බැඳීම ශූන්‍යවීම සහ පෞර්ෂ සංවර්ධනය පිළිබඳ අනාවරණය කර ගැනීම අරමුණු කරගත් ප්‍රගති තක්සේරුවක් මගින් සිදු කරනු ලබන ඇගයීමකි.මෙහිදී සේවාලාභියා භාවිතා කිරීමට පෙළඹීසිටි මත්ද්‍රව්‍ය සඳහා ඇති බැඳීමේ මට්ටම වෙන වෙනම මැනිය යුතුය. බැඳීමේ මට්ටම යන්නෙන් ඒ ඒ මත්ද්‍රව්‍ය පිළිබඳ වන ආකල්පයන්හි වෙනස් වීම, එම මත්ද්‍රව්‍ය භාවිතා කිරීම සඳහා පොළඹවනු ලබන සිතුවිලි පහළවීම හෝ නොවීම, එවැනි සිතුවිලි පහළ වන්නේ නම් එම සිතුවිලි වල ස්වභාවය (සිතුවිලි පහළ වන්නේ කුමන වේලාවකද, එම සිතුවිලි පහළ වූ පසු සේවාලාභියාගේ කායික හා මානසික හැසිරීමේ ස්වභාවය කවරාකාර ද, එම පහළ වූ සිතුවිලි පහව යන්නේ කෙසේද) යන සමස්ත කරුණු පිළිබඳ අදහස් කරයි. එසේම සංවර්ධනය කිරීමට අදහස් කළ පෞරුෂ ගති ලක්ෂණ වල සංවර්ධනීය මට්ටම මෙන්ම මත්ද්‍රව්‍ය භාවිතයත් සමග ඇති වූ දුර්වලතා නිවැරදිවීමේ මට්ටම මැන බැලීම මෙම පළමු ඇගයීමේදී සිදුකළ යුතුය.

## 12.1.(ආ.) දෙවන ඇගයීම

ප්‍රතිකාර කාලය අවසන් කිරීමට සති දෙකකට පෙර සිදුකරනු ලබන සම්පිණ්ඩන ඇගයීමකි. මෙයසේවාලාභියාගේ මත්ද්‍රව්‍ය පිළිබඳ බැඳීම ශූන්‍යවීම ප්‍රමුඛව මත්ද්‍රව්‍යයෙන් නිදහස්වීමට අදාල මනෝවිද්‍යාත්මක මෙන්ම සමාජ විද්‍යාත්මක සාධකයන්හි මට්ටම අණාවරණය කරගනු ලබන ප්‍රගති තක්සේරුවක් ඔස්සේ සිදු කරනු ලබන ඇගයීමකි.විශේෂයෙන් ප්‍රතිකාර කාලය

අවසන් කර ආයතනයෙන් බැහැර වන සේවාලාභියෙකුගේ අනාගත සැලසුම් සකස් කිරීමේදී සැලකිල්ලට ගනු ලබන්නේ මෙම දෙවන ඇගයීම් අවස්ථාවයි. මෙම ඇගයීම තුළින් 12.1.(අ) ඡේදයෙහි විස්තර කරන සමස්ත සාධකයන්ද එසේම මත්ද්‍රව්‍ය සඳහා පෙළඹවීමේ පරිසර සාධක කළමනාකරණය කර ගැනීමේ කුසලතා,සුවවීම සඳහා සුව වීමේ සම්පත් මණ්ඩලය සමඟ ගොඩනගාගෙන ඇති බැඳීම තක්සේරු කිරීම මෙන්ම සමාජගත වීමේදී ඇති විය හැකි ප්‍රමුඛ ගැටලු තක්සේරු කිරීමද සිදුකළ යුතුය.

සැ.යු.- සති 08කට අඩු සමස්ථ ප්‍රතිකාර ක්‍රියාවලියකට සේවාලාභියෙකු යොමු වන අවස්ථාවලදී ඇගයීම් සිදු කරන ප්‍රමාණය හා ඇගයම් සිදු කරන අවස්ථාව අදාල ආයතනයට තීරණය කළ හැකිය.

## 12.2. සේවාලාභීන්ගේ ප්‍රගති තක්සේරුකරණ ක්‍රමවේදය

- ප්‍රධාන වශයෙන් ක්‍රමවේදයන් ත්‍රිත්වයක් ප්‍රගති තක්සේරුකරණයේදී තෝරා ගැනීම සඳහා නිර්දේශ කෙරේ.ඒවා නම්,

  - ප්‍රශ්ණාවලි පදනම් කරගත් ප්‍රගති තක්සේරුකරණය

    මෙහිදී ඒ ඒ ඇගයීම් අවස්ථාවෙන් අපේක්ෂා කරනු ලබන අනාවරණය කර ගැනීම් සිදුකිරීමට උචිත පොදු ප්‍රශ්නාවලියක් සේවාලාභියා වෙත පමුණුවා පිළිතුරු සටහන් කරවා ගැනීමට කටයුතු කළ යුතුය. ඒ සඳහා ඒ ඒ ඇගයීම් අවස්ථාවට උචිත ලෙස සකස් කරගත් පොදු ප්‍රශ්නාවලියක් මධ්‍යස්ථානය තුළ පවත්වාගෙන යා යුතුය.

  - ස්වයං ප්‍රගති තක්සේරුකරණ පෝරමය

    මෙහිදී ඒ ඒ ඇගයීම අවස්ථාවලදී අපේක්ෂිත මැනීම් සඳහා උචිත මූලික ප්‍රස්තුතයන් ලබාදී නිදහසේ සේවාලාභියාට එම ප්‍රස්තුතයන්ට අනුකූලව තමා පිළිබඳ ලිවීමට සලස්වා එමගින් තක්සේරු කිරීම සිදුකළ යුතුය.

  - ප්‍රගති තක්සේරුකරණ සම්මුඛ පරීක්ෂණ ක්‍රමවේදය

    මෙහිදී සේවාලාභියා සමඟ නිදහස් සම්මුඛ සාකච්ඡාවක් පවත්වා ඔහුගේ ප්‍රකාශනයන් මත උපදේශකවරයා විසින් අවශ්‍ය සටහන් කිරීම් සිදුකරගත යුතුය. පවත්වනු ලබන සම්මුඛ සාකච්ඡාව ඒ ඒ ඇගයීම් අවස්ථා සඳහා අනුකූල විය යුතු ය.

අවශ්‍ය නම් සුදුසු ඡායාරූප වීඩියෝ පට සේවාලාභියාට පැමිණවීම සිදුකර ඒවායේ අන්තර්ගත අවස්ථා පිළිබඳව නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්තාව සලසා දීමෙන් හා එහිදී සේවාලාභියාගේ අංග චලනයන් සහ මුහුනේ භාවයන්ගේ වන වෙනස්කම් පිළිබඳව සැලකිලිමත් වෙමින් තක්සේරු කිරීම සිදුකළ හැකිය.

- ප්‍රගති තක්සේරුකරණයේදී සේවාලාභිලාභියාගේ ස්වභාවය (ප්‍රජානන හැකියාව, සාක්ෂරතාවය, විශ්වාසනීයභාවය, පෞර්ෂය ) මත නිර්දේශිත තක්සේරුකරණ ක්‍රමවේද අතුරින් සේවාලාභියාට වඩාත් සුදුසු තක්සේරුකරණ ක්‍රමවේදය නිළධාරියාට තීරණය කළ හැකිය.
- ප්‍රගතිය තක්සේරු කිරීම හරහා ඒ ඒ ඇගයීම් අවස්ථාවට අනුකූල වන පරිදි සකසාගත් පොදු ප්‍රශ්ණාවලි ආකෘති පත්‍රයක් හා පොදු ස්වයං තක්සේරුකරණ අකෘති පත්‍රයක් ආයතනය විසින් පවත්වාගෙන යා යුතුය.

## 12.3. සේවාලාභියාගේ ප්‍රගතිය (තක්සේරුකණය මගින් මනින ලද) සේවාලාභියා සමග සාකච්ඡා කිරීම අනාගත සැළසුම සකස් කිරීම සහ අනාගත සැළසුම පිළිබද සම්මුතිගත වීම.

- සේවාලාභියෙකු සමාජ ගත කිරීමට පෙර ප්‍රගතිය තක්සේරු කිරීමෙන් අනතුරුව සේවාලාභියාගේ ප්‍රතිකාර කටයුතු පෞද්ගලිකව භාරව සිටින සියලුම නිළධාරීන් එක්ව කරනු ලබන Case Conference අවස්ථාවක් තුළදී මෙම අදියර සම්පර්ණ කළ යුතුය. සෑම සේවාලාභියෙකු සදහාම අනාගත සැළසුමක් අවශ්‍ය නොවන අවස්ථා තිබිය හැක. එය තක්සේරුකරණයේ ප්‍රතිඵලය මත තීරණය වේ.
- සේවාලාභියාගේ ප්‍රගතිය පිළිබදව හා තවදුරටත් පවතින දූර්වලතා පිළිබදව ද මෙහිදී විවෘතව සේවාලාභියා සමග සාකච්ඡා කළ යුතු අතර සමාජගත වූ පසු ඔහුගේ කටයුතු සංවිධානය කරනු ලබන ආකාරය පිළිබදව සාකච්ඡා කිරීම හා ඉලක්ක ගොඩනගා ගැනීම ද

සිදු කළ යුතුය. එසේම එම කටයුතු පිළිබද වගවීම සදහා සේවාලාභියා සමග සම්මුතියක් ඇති කර ගැනීම ද සිදු කළ යුතු වේ.

- අනාගත සැළසුමක් තුළ අන්තර්ගත විය යුතු මූලික කරුණු
    - තවදුරටත් මත්ද්‍රව්‍ය බැඳීම යම් කිසි ස්වභාවයකින් ශේෂය පවතී යැයි හඳුනා ගනී නම්, එම බැඳීම ශුන්‍යත්වය ට ගෙන ඒම සඳහා අනුගමනය කළ යුතු යැයි හඳුනා ගනු ලබන ක්‍රියාමාර්ග
    - සුවවීමේ සම්පත් මණ්ඩලය (ඇමිණුම -07 )සුවවීම සඳහා කළමනාකරණය කිරීමේ සැලසුම්
    - බැහැර වන සේවාලාභීන් ප්‍රතිකාර හා නිවාරණ ක්‍රියාවලියේ විවිධාංග සදහා සම්බන්ධ කර ගැනීම සැලසුම් කිරිම
    - බාහිරසේවා නිළධාරීන් ඇතුලු ක්ෂේත්‍රයේ වෙනත් නිළදාරීන් සහ සම්පත්දායකයින් සමග සම්බන්ධතාවය ගොඩනගාදීම (මෙය සේවාලාභියා මධ්‍යස්ථානය තුළ සිටියදීම සිදු කරනු ලබන්නකි )

## 12.4. සේවාලාභියාගේ අනාගත සැළසුම පිළිබදව භාරකරුවන්ට පූර්ණ අවබෝධයක් ලබා දීම හා ක්‍රියාත්මක කිරීමට සහය එල කිරීම සදහා සම්මුතිගතවීම

සේවාලාභියාගේ ප්‍රගතිය පිළිබදවත් අනාගත සැළසුම් තුළින් තවදුරටත් අපේක්ෂා කරන ක්‍රියාකාරකම් ද ඇතුළත් සමස්ථ පසු විපරම් ක්‍රියාවලිය පිළිබදවත් භාරකරුවන් සමග සාකච්ඡා කළ යුතු අතර එය ක්‍රියාත්මක කිරීම සදහා ඔවුන්ගේ සහාය ලබා දීමට එකගතාවයක් ඇති කර ගත යුතුය.

## 12.5. සේවාලාභියෙකු ආයතනයෙන් බැහැරවීම හෝ බැහැර කිරීම

සේවාලාභියෙකු ප්‍රතිකාර පුනරුත්ථාපන ආයතනික පරිශ්‍රයක් තුළින් කෙටි කාල සීමාවකට හෝ සම්පූර්ණ වශයෙන් ඉවත්වී යාම බැහැර කිරීමක් හෝ බැහැර වීමක් ලෙස හදුනා ගනී. එය ගිවිසුම්ගත ප්‍රතිකාර කාලය අවසන්වීමෙන් හෝ ඊට ප්‍රථමව ඇති වන විශේෂ හේතුවක් මත හෝ සිදු වන්නක් විය හැකි ය. එසේම කාර්ය මණ්ඩලයේ අවසරය ඇතිව හෝ නොමැතිව විය හැකි ය.

එපමණක් නොව මිය යාමක් හෝ සියදිවි නසා ගැනීමක්ද විය හැකිය. මෙම කවරාකාර බැහැරවීමකදී වුවද එහිදි අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටියට අනුව  කටයුතු කිරීමට කාර්ය මණ්ඩලය බැඳී සිටී.

**12.5.1. සේවාලාභියෙකු ප්‍රතිකාර මධ්‍යස්ථානයෙන් බැහැර වන අවස්ථා.**

12.5.1.1. ප්‍රතිකාර කාලය සම්පූර්ණ වීම මත

12.5.1.2. ප්‍රතිකාර කාලය සම්පූර්ණ කිරිමට ප්‍රථමයෙන් විශේෂ හේතූන් මත

12.5.1.2.(අ) සේවාලාභියෙකුගේ පෞද්ගලික විශේෂ හේතුවක් මත පිළිගත හැකි ලේඛන සාක්ෂි පාදක කර ගනිමින්, සේවාලාභියා බැහැර කළයුතු බවට වන උපදේශකවරයාගේ නිර්දේශය මත සේවාලාභීන් භාර නිළධාරියා විසින් සිදු කරනු ලබන බැහැර කිරිම්

12.5.1.2.(ආ) පිළිගත හැකි වෛද්‍ය නිර්දේශ පදනම් කර ගනිමින් සෞඛ්‍යමය හේතු මත සේවාලාභියෙකු බැහැර කළයුතු බවට උපදේශකවරයාගේ වන නිර්දේශය මත සේවාලාභීන් භාර නිළධාරියා විසින් සිදුකරනු ලබන බැහැර කිරිම්

12.5.1.2.(ඇ). අධිකරණමය සාධක මත සිදු කරනු ලබන බැහැර කිරීම්

12.5.1.2.(ඈ). සේවාලාභියකු සම්බන්ධයෙන් ආයතනික කාර්ය මණ්ඩලයට පාලනය කර ගැනිමට නොහැකි තරමේ විනය ගැටළුවක් හෝ විනය ගැටළු ඇති වූ විට උපදේශකවරයාගේ නිර්දේශ මත සේවාලාභීන් භාර නිළධාරියා විසින් සිදු කරන බැහැර කිරිම් (මෙය අධිකරණය හරහා යොමු කරනු ලබන සේවාලාභීන් සඳහා අදාල නොවේ)

12.5.1.2.(ඉ). යම් සේවාලාභියකු ප්‍රතිකාර වැඩසටහනට අනුගත වීමට තරම් ප්‍රමාණවත් යැයි උපදේශකවරයා විසින් විශ්වාස කරනු ලබන කාල සීමාවක් ප්‍රතිකාර වැඩසටහන තුළ ක්‍රියාකාරි වීමෙන් අනතුරුව ද ප්‍රතිකාර වැඩසටහන කෙරෙහි සේවාලාභියකු තෘප්තිමත් නොවන අවස්ථාවලදී උපදේශකවරයාගේ වන නිර්දේශය මත සේවාලාභීන් භාර නිළධාරියා විසින් සිදු කරනු ලබන බැහැර කිරිම් (මෙය අධිකරණය හරහා යොමු කරනු ලබන සේවාලාභීන් සඳහා අදාල නොවේ)

12.5.1.2.(ඊ). යම් අවස්ථාවක ආයතනගත කර ගැනීමෙන් අනතුරුව සේවාලාභියකු ප්‍රතිකාර වැඩසටහනට සහ ආයතන ක්‍රියාවලියට අනුගත කර ගැනිමට කායිකව හෝ මානසිකව හෝ චර්යාමය වශයෙන් හෝ ප්‍රමාණවත් මට්ටමක නොමැති බවට වන ප්‍රතිකාර කමිටුවේ නිර්දේශය පදනම් කර ගනිමින්සේවාලාභීන් භාර නිළධාරියා විසින් සිදු කරනු ලබන බැහැර කිරිම්

12.5.1.2.(උ). අධිකරණයෙන් යොමු කරන ලද සේවාලාභීන් ආයතනයෙන් බැහැර කිරිම

12.5.1.2.(ඌ). ප්‍රතිකාර කාලසීමාව අතරතුර අනවසරයෙන් වන බැහැරවීම්.

12.5.1.2.(එ). පොදු වශයෙන් පිළිගත හැකි සෞඛ්‍යමය අවශ්‍යතා ප්‍රතිකාරාත්මක (පුනරුත්ථාපන) අවශ්‍යතා සහ පුද්ගලික අවශ්‍යතා මත කෙටි කාලසීමාවක් සඳහා වන බැහැරවීම්.

**උදා :-**

- ඖෂධ ලබා ගැනිම
- රෝහල් ගතවීම
- විනෝද චාරිකා
- අධ්‍යාපන චාරිකා
- ක්‍රිඩා කටයුතු
- ශ්‍රමදාන කටයුතු
- සමීපතමයෙකුගේ අවමංගල්‍යයක්
- සම්මුඛ පරීක්ෂණ
- විභාග සඳහා ඉදිරිපත්වීම
- විදෙස් ගමන් බලපත්‍ර සකස් කිරීම ආදී වශයෙන් වන බැහැරවීම්

12.5.1.2. (ඒ). සිය දිවි නසා ගැනීම හෝ මිය යෑම.

- සැ.යු - ඉහත සදහන් උපදේශකවරයා විසින් සිදුකරනු ලබන සෑම නිර්දේශයක්ම සේවාලාභියාගේ ප්‍රතිකාරය පුද්ගලික භාර වන සියළුම නිලධාරින් (උපදේශක,සහකාර

උපදේශක,උපදේශන සහකාර) සමඟ සිදු කරනු ලබන සාකච්ඡාවක එකගතාවය පදනම් කර ගනිමින් විය යුතුය.

- ආයතනික නිල ධූරාවලිය තුළ එම ආයතනගත සේවාලාභීන් භාර නිළධාරියා (මධ්‍යස්ථානයක් තුළ සේවාලාභීන්ගේ භාරකාරීත්වය පැවරෙන නිළධාරියා) කවුරුන්ද යන වග නිර්වචනය විය යුතු අතර එය සාපේක්ෂව ස්ථාවර කාලයක් සඳහා විය යුතුය. සේවාලාභීන් භාර නිළධාරියා කළමණාකරු, උපදේශකවරයා, හිමිකරු, අධ්‍යක්ෂකවරයා හෝ වෙනයම් තනතුරක් දරන්නකු විය හැකිය.

## 12.6. සාමාන්‍ය ලෙස සේවාලාභියකු බැහැර කරන මොහොත වන විට සපුරා තිබිය යුතු කොන්දේසි.

- ආයතනයට ඇතුළත් කිරීමේදී එකග වූ ප්‍රතිකාර කාලසීමාව සම්පූර්ණ වී තිබීම (නිවැරදි ප්‍රතිකාර කාලය සම්පූර්ණ කරන සේවාලාභීන් සඳහා පමණක් වලංගු වේ).
- සේවාවාලාභියාට අදාල පුද්ගලික ලිපි ගොණුව සම්පූර්ණ වී තිබීම (නිවැරදි ප්‍රතිකාර කාලය සම්පූර්ණ කරන සේවාලාභීන් සඳහා පමණක් වලංගු වේ).
- අනාගත සැලසුමක් අවශ්‍ය නොවේ යැයි ප්‍රතිකාර කාර්යය මණ්ඩලය තීරණය නොකළ විටකදී අනාගත සැලැසුම සම්පූර්ණ වී තිබීම.
- බැහැර වන දිනය වේලාව හා සේවාලාභියා භාර ගැනීමට පැමිණෙන ලෙස මෙන්ම බැහැර වීමට අදාළ වෙනත් අවශ්‍යතා වෙතොත් ඒවා ද භාරකරුවන් වෙත පූර්වයෙන් දැනුම් දීම.
- පසුරැකවරණ වැඩසටහනට ඇතුළත් කර ගැනීම සහ බාහිර සේවා නිලධාරීන්ගේ සබඳතාවය ගොඩනැංවීම.
- සේවාලාභියා ආයතනයෙන් බැහැර වන බව සේවාලාභියා භාර නිළධාරියා දැනුවත් කිරීම.

## 12.7. සේවාලාභීන් බැහැර කිරීමට අදාලව ගත යුතු තාක්ෂණික ක්‍රියාමාර්ග.

### 12.7.(අ). ස්වේච්ඡාවෙන් ඇතුළත් වූ සේවාලාභියෙකු ආයතනයෙන් බැහැර කිරීම.

- සේවාලාභියකු ආයතනයෙන් බැහැරවීමේ ප්‍රකාශන පත්‍රය සම්පූර්ණ කිරීම (ඇමිණුම- 08).
- ආයතනය මගින් පවත්වාගෙන යනු ලබන සේවාලාභියෙකු බැහැර කිරීමේදී සටහන් යෙදිය යුතු සියලු ලේඛන වල අදාල සටහන් යෙදීම.
- ප්‍රතිකාර සටහන් ලිපි ගොණුවෙහි සේවාලාභියා බැහැර වන බව සටහන් කිරීම.

යන කරුණු සම්පූර්ණ කළ පසු භාරකරුවන් සමඟ සේවාලාභියා ආයතනයෙන් බැහැර කළ යුතු ය.

- භාරකරුවන් නොමැති සේවාලාභියෙකු නම් භාරකරුවකු නොමැතිව ඔහු ඉවත්ව යන බවට ලිඛිත ප්‍රකාශයක් ලබා ගැනීම සිදු කළ යුතු ය.
- ප්‍රතිකාර කාලය සම්පූර්ණ කිරීමට ප්‍රථමයෙන් විශේෂ හේතූන් මත සිදුකරනු ලබන බැහැර කිරීමක් නම් සේවාලාභියකු ආයතන බැහැරවීමේ ප්‍රකාශන පත්‍රයෙහි 12.5.1.2.වගන්තියෙන් විස්තර වන බැහැර කිරීම්සඳහා වෙන් වී ඇති කොටස සම්පූර්ණ කිරීම සිදු කළ යුතුය
- 12.5.1.2.(අ)/12.5.1.2.(ආ)/12.5.1.2.(ඇ)යන වගන්ති මගින් විස්තර වන බැහැර කිරීම් සිදු කරන විට අදාල සාක්ෂිමය ලේඛන වල උපදේශන නිළධාරියා විසින් සහතික කළ ඡායාපිටපත් සේවාලාභියාගේ පෞද්ගලික ලිපි ගොණුවට ඇමිණීම සිදු කළ යුතුය.

### 12.7.(ආ). අධිකරණය මගින් යොමු කරනු ලබන සේවාලාභියකු ආයතනයෙන් බැහැර කිරීම.

- අධිකරණය මගින් පුනරුත්ථාපනය සඳහා යොමු කරනු ලබන සේවාලාභීන් ආයතනය මගින් බැහැර කිරීමට අවසරය අධිකරණ මගින් ලබාදී ඇති විටෙක 12.7.(අ)වගන්තියෙහි විස්තර කෙරෙනක්‍රමවේදය භාවිතා කළ යුතු ය. එයට අමතරව ප්‍රතිකාර අධ්‍යක්ෂවරයා නොහොත් අදාල බලයලත් නිළධාරියා (විධිමත් පුනරුත්තාපන ආයතනයක අධිකරණය වෙත සිදු කරනු ලබන දැනුම්දීම් ප්‍රතිකාර අධ්‍යක්ෂකවරයාගේ අත්සනින් විය යුතුය. එම බලය වෙනත් අයෙකුට පවරා ඇත්නම් එය එම පැවරීම ලද තැනැත්තාට ද එය ඉටු කළ හැකිය.)වෙත

දැනුම් දීමේ පෝරමය ද සම්පූර්ණ කර එමගින් අධ්‍යක්ෂකවරයා නොහොත් අදාල බලයලත් නිළධාරියා වෙත දැනුම් දීමට කටයුතු කළ යුතුය. එහිදී 12.6. වගන්තියෙහි සඳහන් සමස්ථය සම්පූර්ණ වී තිබිය යුතුය.තවද සේවාලාභියා බැහැර කළ බව අධ්‍යක්ෂකවරයා නොහොත් අදාල බලයලත් නිළධාරියා විසින් ලිඛිතව අධිකරණය දැන්වත් කිරීමට කටයුතු කළ යුතුය.

- සේවාලාභියකු ප්‍රතිකාර කාලය අවසන් කර බන්ධනාගාරයට භාර කරන ලෙස තීන්දුව ප්‍රකාශයට පත් කර ඇති විටෙක අදාල දිනයට පෙර බන්ධනාගාරය දැනුවත් කර අදාළ දිනයේදී බන්ධනාගාරයට බාර දීම සිදු කල යුතුය.එහිදී බැහැර කිරිමේ දී අනුගමනය කරන 12.6වගන්තියෙහි විස්තර වන සියල්ල සම්පූර්ණ කර 12.5.1(අ).වගන්තියෙහි සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරමින් බන්ධනාගාරය සඳහා සේවාලාභීන් භාරදීමේදීමේ පෝරමය සම්පූර්ණ කර බන්ධනාගාර නිළධාරීන් වෙත බැහැර කිරිම සිදු කල යුතුය. මෙහිදී සේවාලාභියාගේ භාරකරුවන් ආයතනයට කැඳවීම අවශ්‍ය නොවේ.
- අධිකරණය මගින් ප්‍රතිකාරය සඳහා යොමු කළ සේවාලාභියකු ප්‍රතිකාර මධ්‍යස්ථානය තුළ පවත්වාගෙන යාම ඵල රහිත බවට හෝ පවත්වාගෙන යාම ගැටලු සහිත බවට ප්‍රතිකාර කාර්යය මණ්ඩලය නිගමනය කරනු ලබන මොහොතක ඒ බව ලිඛිතව අධිකරණය වෙත දැනුම් දිය හැකි ය. ඒ අනුව සේවාලාභියා ආයතනයෙන් බැහැර කිරීමට අවසර ලැබුනහොත් එම අවසරය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.එහිදී ඉහත තාක්ෂණික ක්‍රියාමාර්ග අනුගමනය කරමින් බැහැර කිරීම සිදු කළ යුතු ය.
- අධිකරණය මගින් යොමු කළ සේවාලාභියෙකු නේවාසික ප්‍රතිකාර සඳහා රෝහලගත කිරීමකදී ඒ පිළිබඳ බන්ධනාගාරය දැනුවත් කර අදාල රෝහල්ගත කාලසීමාව තුළ සේවාලාභියාගේ ආරක්ෂාව තහවුරු කරන ලෙස දැනුම්දිය යුතුය.

**12.7.(ඇ). සේවාලාභියෙකු ආයතනයෙන් අනවසරයෙන් බැහැර වීම.**

- අධිකරණය මගින් යොමු කළ සේවාලාභියෙකු හෝ ස්වේච්ඡා සේවාලාභිකු අනවසරයෙන් ආයතනයෙන් බැහැර වූවහොත්,
    - ✓ සේවාලාභීන් භාර නිළධාරියා දැනුවත් කිරීම

- ✓ සේවාලාභියාගේ භාරකරුවන් දුරකථන මාර්ගයෙන් දැනුවත් කිරීම හෝ දුරකථන මාර්ග අවහිර වී ඇති විටක ටෙලි මේල් පණිවිඩයක් මගින් භාරකරුවන් දැනුවත් කිරීම.
- ✓ මධ්‍යස්ථානයට අදාල පොලිසියෙහි පැමිණිල්ලක් ගොණු කිරීම.
- ✓ ආයතන ප්‍රධානියා හෝ වෙනත් පරිපාලන නිළධාරියකු අදාල සිදුවීම සම්බන්ධයෙන් සේවාලාභීන්ගේ සහ සේවයේ යෙදී සිටි නිළධාරීන්ගේ සාක්ෂි සටහන් කරගැනීම.
- ✓ ප්‍රතිකාර ලිපි ගොණුවෙහි සිදුවීම සම්බන්ධ විස්තරය සටහන් කිරීම.
- ✓ ආයතනය තුළ පවත්වාගෙන යනු ලබන සේවාලාභියෙකු බැහැරවීමේදී සටහන් යෙදිය යුතු සියලු ලේඛන වල අදාල සටහන් යෙදීමහා බැහැරවීම පිළිබද ප්‍රතිකාර අධ්‍යක්ෂකවරයා දැනුවත් කිරීම.
- ✓ අනවසරයෙන් බැහැර වන සේවාලාභියා අධිකරණය මගින් යොමු කළ අයෙකු නම් අදාල බැහැරවීම පිළිබද දුරකථනය මගින් බන්ධනාගාරය දැනුවත් කිරීම හා අධ්‍යකවරයා නොහොත් අදාල බලයලත් නිළධාරියා විසින් ලිඛිතව අධිකරණය දැනුවත් කිරීම.

**12.7.(ඉ). පිළිගත හැකි සෞඛ්‍යමය අවශ්‍යතා, ප්‍රතිකාරාත්මක (පුනරුත්ථාපන) අවශ්‍යතා සහ පුද්ගලික අවශ්‍යතා මත කෙටි කාලසීමාවක් සඳහා වන බැහැරවීම්.**

- ප්‍රතිකාර කාලසීමාව අතරතුරදී සෞඛ්‍යමය හෝ ප්‍රතිකාරාත්මක (පුනරුත්ථාපන) හෝවෙනත් පිළිගත හැකි පුද්ගලික හේතුවක් මතහෝ සේවාලාභියකු ආයතනයෙන් කෙටි කාලසීමාවක් සඳහා බැහැරට රැගෙන යාමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා සේවාලාභියාගේ භාරකරුවන්ගෙන් එකගතාවය එල කරන ලිපියක් සේවාලාභියා ආයතනගත කර ගැනීමේදී ලබාගෙන තිබීම.
- සේවාලාභියා ආයතනයෙන් බැහැරට යන අවස්ථාවේ සේවාලාභියාගේ කැමැත්ත සඳහන් ලිපියක් ලබාගෙන තිබීම.

- සේවාලාභියෙකුගේ ආරක්ෂාව සැපයීම සඳහා ප්‍රමාණවත් තරම් නිළධාරීන් යෙදවීමේ හැකියාව තහවුරු වීම.

යන කොන්දේසි සම්පූර්ණ වූ බවතහවුරු කරගත් පසුව බැහැරට යාමේ කෙටි කාලීන අවශ්‍යතාවය පිළිබඳ ආයතන ප්‍රධානියා සෑහීමකට පත් වේ නම් හා ඒ හා සබැදි වෙනත් පරිබාහිර ගැටලුකාරී තත්ත්වයන් නොමැති බව පෙනී යයි නම් වගකීම පවරනු ලබන නිළධාරීයා හෝ නිළධාරීන් සමග සේවාලාභියා හෝ  සේවාලාභීන් ආයතන ප්‍රධානියාගේ අවසරය මත කෙටිකාලීනව ආයතනයෙන් බැහැර කළ හැකිය.

- නේවාසික ප්‍රතිකාර සඳහා සේවාලාභියෙකු රෝහල්ගත කිරීමකදී ආයතනයෙන් රෝහල වෙත රැගෙන යාමට පෙර හා රෝහල්ගත කළ පසුව භාරකරුවන් දුරකථන මාර්ගයෙන් දැනුවත් කළ යුතුය.භාරකරුවන් දුරකථන මාර්ගයෙන් සම්බන්ධ කරගත නොහැකි විටක ඒ පිළිබඳ සේවාලාභියාගේ ප්‍රතිකාර ලිපිගොණුවෙහි සටහන් තබා රෝහල්ගත කිරීමෙන් අනතුරුව නිළධාරියෙකු හෝ ටෙලිමේල් පණිවිඩයක් මගින් භාරකරුවන් දැනුවත් කළ යුතුය.

සැ.යු.ඉහත 12.7.(ඉ) ඡේදයෙහි විස්තර කෙරෙන ක්‍රමවේදය අධිකරණය මගින් යොමු කළ සේවාලාභීන් සඳහා අදාල නොවේ.

## 12.7.(ඉ). සේවාලාභියෙකු මිය යාම හෝ සියදිවි නසාගැනීම

- ප්‍රතිකාර කාලය තුළ සේවාලාභියෙකු මියගියහොත්, මරණය සිදුව ඇත්දැයි තවදුරටත් තහවුරු කර ගැනීමේ අවශ්‍යතාවයක් පවතින බව කාර්ය මණ්ඩලයට හැඟී යයි නම් ඒ පිළිබඳ ආයතන ප්‍රධානියා දැනුවත් කර හැකි ඉක්මණින් රජය පිළිගත් වෛද්‍යමය මැදිහත්වීමක් වෙත යොමුවීම.
- සේවාලාභියාගේ පෞද්ගලික ප්‍රතිකාර ලිපිගොණුවෙහි සමස්ථ සිදුවීම විධිමත්ව එම මොහොතේ සේවයේ නියුතු නිළධාරියෙකු විසින් සටහන් කිරීම හා අදාල සිදුවීම පිළිබඳ අදාල පොලිස්ථානය වෙත පැමිණිලි කිරීම.
- මිය යාම හෝ සියදිවි නසා ගැනීම පිළිබඳ භාරකරුවන් දැනුවත් කිරීමට කටයුතු කිරීම.

- සේවාලාභියාට අදාලව බැහැර කිරීම සටහන් කළ යුතු ආයතනය සතු සියලුම ලේඛන වල අදාල සිදුවීම සටහන් කිරීම හා ලිපිගොණුවෙහි මුල් පිටුවෙහි පැහැදිලිව පෙනෙන ලෙස මිය යාම සටහන් කිරීම.
- මිය යාමට අදාල ස්ථානීය නෛතික කටයුතු විධිමත්ව අවසන් වූ පසු මෘත දේහය භාරකරුවන් වෙත භාර දිමට කටයුතු කිරීම.

යන ක්‍රියාමාර්ග මරණය සිදුවන මොහොතේ පුනරුත්ථාපන ආයතනයේ සේවයේ නියුතු නිළධාරීන් විසින් සම්පූර්ණ කළ යුතුය.

# 13. පසුරැකවරණය

සේවාලාභියා උපදේශන ක්‍රියාවලියෙන් හෝ නේවාසික ප්‍රතිකාරයෙන් පසු සමාජගත වී මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස්ව පැවතීමට හා සාමාන්‍ය ජීවිතයේ මතු වන අභියෝග සඳහා මුහුණ දීමට අවශ්‍ය සහය වීම හා ශක්තිය ගොඩනැගීම පසුරැකවරණ ක්‍රියාවලිය ලෙස හදුනාගත හැකිය. (ඇමුණුම- 09).

## 13.1. පසුරැකවරණයේ වැදගත්කම.

නේවාසික මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන සේවාලාභියෙකුට පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි මත්ද්‍රව්‍ය රහිත පරිසරයක් තුළ ජීවත් වීමේදී මුහුණ දීමට සිදුවන අභියෝග වලට සාපේක්ෂව ආයතනයෙන් පිටත මත්ද්‍රව්‍ය සුලභ පරිසරයක් තුළදී මුහුණ දීමට සිදු වන අභියෝග සංකීර්ණය. එවැනි සංකීර්ණ අවස්ථා වලට මුහුණ දිමේදී ඇති වන අපහසුතා කළමණාකරණය කර ගැනීමට පසුරැකවරණය ඉතා වැදගත් වෙයි.

## 13.2. පසුරැකවරණයේ අරමුණු.

පුනරුත්ථාපන ආයතනයක කිසියම් වු උපදේශන සේවාවක් සඳහා හෝ නේවාසික ප්‍රතිකාරය සඳහා යොමු වු ඕනෑම අයෙකුගේ ජිවිතයේ අඛණ්ඩ යහපැවැත්ම ඇති කිරිම පසුරැකවරණයේ ප්‍රමුඛ අරමුණ වෙයි.

## 13.3. පසුරැකවරණ ක්‍රියාවලිය.

පසුරැකවරණ ක්‍රියාවලියක් තුළ ප්‍රවේශයන් කිහිපයක් හදුනාගත හැකිය.

1. පුනරුත්ථාපන මධ්‍යස්ථානය මගින් සිදු කෙරෙන පසුරැකවරණ ක්‍රියාවලිය.
2. බාහිර සේවා නිළධාරීන් මගින් හා ක්ෂේත්‍රයේ වෙනත් නිළධාරීන් මගින් සිදු කෙරෙන පසුරැකවරණ ක්‍රියාවලිය.
3. පසුරැකවරණයේදී සේවාලාභියාගෙන් අපේක්ෂා කරනු ලබන මැදිහත්වීම.
4. පසුරැකවරණයේදී භාරකරුවන්ගෙන් අපේක්ෂා කරනු ලබන මැදිහත්වීම.

### 13.3.1 පුනරුත්ථාපන මධ්‍යස්ථානය මගින් සිදුකෙරෙන පසුරැකවරණ ක්‍රියාවලිය.

- පසුරැකවරණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සූදානම ඇති කිරිම.
- පසුරැකවරණය පිළිබඳ පූර්ව උපදේශනයේ සිට දැනුවත් කිරිම.
- පසුරැකවරණය පිළිබඳ දෙමාපිය හමු වලදී දෙමාපියන්ට හා භාරකරුවන්ට නිසි ලෙස සන්නිවේදනය කිරිම.
- පසුරැකවරණය පිළිබඳ බාහිර සේවා නිළධාරීන් දැනුවත් කිරිම.
- පසුරැකවරණ වැඩසටහන් පත්‍රිකාව සමග සේවාලාභියා බැහැර කිරිමට සූදානම් කිරිම.
- පසුරැකවරණ හමුව සංවිධානය කිරීම.
- පසුවිපරම් හමුව තුළ,
  - ✓ මත්ද්‍රව්‍ය ආශ්‍රිත ඉගෙනුම් පද්ධතිය තවදුරටත් වෙනස් කිරිම.
  - ✓ වැරදි විශ්වාස පද්ධතිය වෙනස් කිරිම.
  - ✓ ආකර්ශනය සහ බැඳීම ශුන්‍ය කිරිම.
  - ✓ මිත්‍යා මත අභියෝගයට ලක් කිරිම.
  - ✓ සේවාලාභීන් සමීප ඇසුරක් පවත්වන මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලන්ගේ නොවැදගත් බව අවබෝධයට ඉඩ සැලැස්වීම.
  - ✓ මත්ද්‍රව්‍යයෙන් නිදහස්වීමේ ආකල්පයන් විවර කරන ක්‍රීඩාවන් පැවැත්වීම (සිතුවිලි ක්‍රීඩා වැනි).
  - ✓ සේවාලාභියාට විවෘතව පැවසිය නොහැකි ගැටලු කාර්ය මණ්ඩලය විසින් පොදු මාතෘකාවක් ලෙස සාකච්ඡා කිරිම.
  - ✓ පෞරුෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
  - ✓ දෙමාපියන් තුල පවතින නිවැරදි නොවන මත්ද්‍රව්‍ය ආකල්ප වෙනසකට ලක් කිරිම.
  - ✓ මතින් නිදහස් සේවාලාභින් වෙන් කොට හඳුනාගනිමින් මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රජා පාදක වැඩසටහන් ක්‍රියාත්මක කිරිම හා නායකත්වය ලබා දීම.

- ✓ සම්පත් දායකයින්ගේ විශේෂ වැඩසටහන් පැවැත්වීම (පොලිසිය/ වෛද්‍යමය/නීතිඥ/ප්‍රථමාධාර ආදි).
- ✓ විනෝදාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
- ✓ ආගමික සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම වැනි අංගයන් ඇතුළත් කිරීම.

- පසුරැකවරණ වැඩසටහන් සඳහා නිශ්චිත දින වෙන් කර ගැනීම.
- ඇගයුම් පත්‍රිකාව සකස් කර ගැනීම.
- පසුරැකවරණ කාල සටහන් සකස් කර ගැනීම.
- අවම වශයෙන් මාස තුනකට වරක් දුරකථනය මගින් සේවාලාභියා පිළිබඳ විමසීම් කිරීම.
- පසුරැකවරණ ලිපි  ගණුදෙණු සිදු කිරීම.
- මාර්ගගත ක්‍රම ඔස්සේ පසුරැකවරණ හමු සංවිධානය කිරීම.
- මධ්‍යස්ථානයේ ප්‍රතිකාරය භාර නිළධාරීන්ගේ හා බාහිර සේවා නිළධාරින්ගේ අවබෝධය මත අවශ්‍යතා සහිත සේවාලාභින්ට එක් දිනක්  හෝ නිශ්චිත කාලයක් සඳහා මධ්‍යස්ථානයේ ගත කිරිමට අවස්ථාව ලබා දීම.
- සේවාලාභීන් නිළධාරින් වෙතට ගමන් කිරිම.
- නිළධාරින් සේවාලාභීන් වෙතට ගමන් කිරිම.
- උපකාරක පුද්ගලයන් හා උපකාරක ආයතන හඳුන්වාදීම.

### 13.3.2. බාහිර සේවා නිළධාරී මගින් හා අදාල ක්ෂේත්‍ර නිළධාරීන් මගින් සිදු කෙරෙන පසුරැකවරණ ක්‍රියාවලිය.

- බාහිර සේවා නිළධාරීන්  අදාල සේවාලාභින්ගේ නිවෙස් වෙත ගොස් සේවාලාභියාගේ තත්ත්වය  පිළිබඳ මාසික වාර්තාවක් ආයතනයට ලබා දීම.
- දිනක් හෝ නිශ්චිත සුදුසු කාලයක් සඳහා ආයතනගත කිරීමට අවශ්‍ය සේවාලාභීන්ට පමණක් ආයතනගත වීමට නිර්දේශ ලබාදීම.

- සුභ සාධන සේවා සපයන නිළධාරින්ගේ සහයෝගය ලබා ගැනීම (ප්‍රජා විශෝධන/ පරිවාස නිළධාරි/ ග්‍රාම නිළධාරි ආදී).
- ප්‍රාදේශීය වශයෙන් බැහැර වූ සේවාලාභීන් එකතු කර වසරකට වරක්වත් හමුවක් සූදානම් කිරිම.
- මත්ද්‍රව්‍ය ඉගෙනුම් පද්ධතිය වෙනස් කිරිම.
- සමාජ ආන්තීකරණයට ලක්වන සේවාලාභීන් සම්බන්ධයෙන් ප්‍රජාව තුළ සුභවාදී ආකල්පයක් ඇති කිරිම.
- තක්සේරුකරණය මගින් සේවාලාභීන්ගේ මට්ටම තීරණය කර සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරිම.
- මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් සේවාලාභීන්ගේ සහාය භාවිතාකරන සේවාලාභීන්ව භාවිතයෙන් නිදහස් කර ගැනීමට උපයෝගී කර ගැනීම.
- සේවාලාභියා හා ප්‍රජාව අතර යහපත් සම්බන්ධතාවයක් ඇති කිරීමට සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 13.4. පසුරැකවරණයේදී සේවාලාභියාගෙන් අපේක්ෂා කරනු ලබන මැදිහත් වීම.

- ප්‍රතිකාරයේ දෙවන අදියර පසුරැකවරණය බව සිහි තබා ගත යුතුය.
- භාවිත පරිසරය තුළ නිදහස්ව පැවතීමේදී මතුවන ගැටලු සඳහා විසඳුම් ලබාගැනීම.
- භාවිතයට හසුකර ගැනීමේ ව්‍යාපාර උපක්‍රම පිළිබඳ නිරන්තර අවධානයෙන් පසුවීම.
- නිරන්තරයෙන් පවුල් සමග යහපත් මට්ටමින් සම්බන්ධතා පවත්වා ගෙන යෑම.
- ජීවිතයේ නව මංපෙත් විවරකර ගැනීම සඳහා ඊට අවශ්‍ය දැනුම ලබා ගැනීම.
- ඉගෙනුම් අවස්ථා ඇති කර ගැනීම.
- ආයතනය සමග නිරන්තර සම්බන්ධතා පැවැත්වීමට අදාල සහභාගීවීම්, යොමුවීම්, දුරකථන ඇමතුම් යන සන්නිවේදන ක්‍රියාවලිය නිසි අයුරින් පවත්වා ගෙන යෑම.
- ස්වයං තීරණ ගැනීමේදී නිවැරදි මග පෙන්වීම් සිදුකරන පුද්ගලයන් සමග සාකච්ඡා කිරීම.
- භාවිතා කරන පුද්ගලයන් සමග සම්බන්ධතා නොපැවැත්වීම හා ඊට අනුබල නොදීම.

- ඉදිරි සැලසුම් පිළිබඳව නිරන්තරයෙන් සැළකිලිමත් වීම සහ ඊට අවශ්‍යම උපදෙස් ලබාගැනීම.
- අනපේක්ෂිත සිදුවීම් අවස්ථා වලට නිවැරදි ප්‍රතිචාර දැක්වීම හා මුහුණ දීම.
- අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා තම ආගමික නැඹුරුත්වය ඇති කර ගැනීම.
- යහපත් ආකාරයෙන් සමාජ සම්බන්ධතා පවත්වා ගැනීම.
- සැළසුම් අඛණ්ඩව පවත්වා ගෙන යෑම.
- යම් කාලයක් තුල ස්වයං ඇගයීමකට ලක්වීම.
- මත්ද්‍රව්‍ය භාවිතයට සිත යොමු වන අවස්ථාවන් වලදී  නිළධාරීන් හෝ සම්පත් දායකයන් සමග සම්බන්ධ වීම.
- ප්‍රාථමික මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වළක්වා ගැනීම සම්බන්ධයෙන් නිරන්තර උපදේශන සේවාවන් ලබාගැනීම.

## 13.5. පසුරැකවරණයේදී භාරකරුවන්ගෙන් අපේක්ෂා කරනු ලබන මැදිහත්වීම.

- බැහැර වූ මොහොතේ සිටම යහපත් පිළිගැනීමක් ලබා දීම.
- ප්‍රතිකාරය තුල සැලසුම් කර ගත් පරිදි කටයුතු ක්‍රියාත්මක කිරීම.
- සේවාලාභියාගේ අවශ්‍යතා හඳුනාගැනීම.
- සේවාලාභියාගේ ගැටලු හඳුනාගැනීම (කායික මානසික රෝග හා ගැටලු).
- සතියකට වරක් සේලාභියා  පිළිබඳ දන්වා ප්‍රතිකාර මධ්‍යස්ථානයට දුරකථන ඇමතුමක්  ලබා දීම.
- මසකට වරක් සේවාලාභියා සමග ආයතනයට පැමිණීම.
- ආයතනය සමග සමීප සබදතා පැවැත්වීම.
- සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් හා පහසුකම් සපයා දීම.
- සේලාභියා පිළිබද නිරන්තර අවධානයෙන් පසුවීම.
- සේවාලාභියාගේ රුචි - අරුචිකම් හඳුනාගැනීම.
- සෘණාත්මක වෙනස්වීම් දෙසඋපේක්ෂාවෙන් බැලීම (වෙනස් කර ගැනීමට කටයුතු කිරීම).

- නිසි උපදේශන සේවාවන් ලබා ගැනීම.
- මානසික සුවදායි පරිසරයක් පවත්වා ගෙන යෑම.
- දෙමාපිය ගැටලු දරුවාට බලපාන මට්ටම අවම කිරීම.
- සේවාලාභියාගේ පුද්ගල සම්බන්ධතා පිලිබද සැලකිලිමත් වීම.
